





# වාර්ෂික වාර්තාව 2016

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

# පටුන


| අංශය | පිටු අංකය |
|---|---|
| 1. සංස්ථාගත තොරතුරු | 01 |
| 2. තොරතුරු දැනගැනීමේ පනත | 04 |
| 3. දැක්ම හා මෙහෙවර | 05 |
| 4. කාර්ය සාධන දර්ශකයන් | 07 |
| 5. සභාපතිතුමාගේ පණිවුඩය | 13 |
| 6. අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය | 17 |
| 7. අධ්‍යක්ෂ මණ්ඩලය | 20 |
| 8. ජ්‍යෙෂ්ඨ කළමනාකරණය | 21 |
| 9. මධ්‍යම කළමනාකරණය | 22 |
| 10. අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව | 23 |
| 11. අධ්‍යක්ෂවරුන්ගේ පණිවුඩ | 28 |
| 11.1. වෙරළබඩ ජලජීවී වගා සංවර්ධන අධ්‍යක්ෂවරයාගේ ඇගයීම | 28 |
| 11.2. මිරිදිය ජලජීවී වගා සංවර්ධන අධ්‍යක්ෂවරයාගේ ඇගයීම | 32 |
| 11.3. ව්‍යාප්ති අංශයේ අධ්‍යක්ෂවරයාගේ ඇගයීම | 35 |
| 11.4. ජලජීවී වගා සංවර්ධන ඉංජිනේරුවරයාගේ ඇගයීම | 37 |
| 12. මානව සංවර්ධන අංශයේ වාර්තාව | 38 |
| 13. විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව | 40 |
| 14. විගණකවරයාගේ වාර්තාව | 43 |
| 15. මූල්‍ය ප්‍රකාශනය | 59 |

# 1. සංස්ථාගත තොරතුරු

**ලියාපදිංචි නාමය**
ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

**ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ නීතිමය තත්වය**
1998 අංක 53 දරණ ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරි පනත ප්‍රකාරව 1999 වර්ෂයේ ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (නැක්ඩා) ස්ථාපනය කරන ලදි. ශ්‍රී ලංකාවේ ජලජීවී වගාව සහ මිරිදිය ධීවර කර්මාන්තය යන අංශයන් දියුණු කිරීම සඳහා පිහිටුවන ලද ප්‍රමුඛ රාජ්‍ය ආයතනය මෙම අධිකාරිය වේ. වර්තමානයේ මෙම ආයතනය ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යංශය යටතේ ක්‍රියාත්මක වේ.

**ප්‍රධාන කාර්යාලය**
නො. 41/1, නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා.
ටෙලි : 011 2786575
වෙබ් : www.naqda.gov.lk

❖ **ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන**

| | | |
|---|---|---|
| 01. ඉගිණියාගල ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානය | ආර්. එම්. කීර්තිසිරි මහතා | සහකාර අධ්‍යක්ෂ(මිරිදිය), ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානය, ඉගිණියාගල. |
| 02. දඹුල්ල ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානය | සී. එස්. අයි. පතිරණ මහතා | සහකාර අධ්‍යක්ෂ(මිරිදිය), ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානය, දඹුල්ල. |
| 03. උඩවලව ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානය (කාප්) | කේ. එම්. ඩී. එම්. සෝමරත්න මහතා | සහකාර අධ්‍යක්ෂ(මිරිදිය), ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානය(කාප්) උඩවලව. |
| 04. උඩවලව ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානය (කාප් වර්ධක) | කේ. එම්. ඩී. එම්. සෝමරත්න මහතා | සහකාර අධ්‍යක්ෂ(මිරිදිය), ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානය(කාප්) උඩවලව. |
| 05. උඩවලව ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානය (තිලාපියා) | එච්. කේ. ජගත් කීර්ති මහතා | ස්ථාන භාර නිලධාරි, ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානය(තිලාපියා) උඩවලව. |
| 06. කලාවැව මිරිදිය ධීවර හා ජලජීවී වගා පුහුණු ආයතනය | ආර්. එච්. පොතුවිල මහතා | සහකාර අධ්‍යක්ෂ(පුහුණු), මිරිදිය ධීවර හා ජලජීවී වගා පුහුණු ආයතනය, කලා වැව, විජිතපුර. |
| 07. නුවරඑළිය ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානය | ටී. සී. ඊ. විජය හේවා මහතා | ස්ථාන භාර නිලධාරි, ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානය, බඹරකැලේ, නුවරඑළිය. |
| 08. මුරුතවෙල ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානය | එම්. යු. ඩබ්ලිව්. මුතුනායක මහතා | සහකාර අධ්‍යක්ෂ(මිරිදිය), ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානය, මුරුතවෙල, ජුලම්පිටිය. |
| 09. ඉරණමඩුව ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානය | කේ. ප්‍රතීෂ් මහතා | ස්ථාන භාර නිලධාරි, ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානය, ඒ 9 පාර, වඩ්ඩකච්චි, ඉරණමඩු. |

### ❖ දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති කාර්යාල

| | | | |
|---|---|---|---|
| 01. | අම්පාර | ඩබ්. ඒ. ජේ. ආර්. ප්‍රනාන්දු මහතා | සහකාර අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති කාර්යාලය, ගල්කන්ද මාවත, අම්පාර. |
| 02. | අනුරාධපුර | එස්. ජී. සී. සිසිත කුමාර මහතා | දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති නිළධාරී, දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති කාර්යාලය, ධීවර සංස්ථා පාර, අනුරාධපුර. |
| 03. | බදුල්ල | ආර්. ජී. පී. මඩුගල්ල මහතා | දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති නිළධාරී, දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති කාර්යාලය, 17 කනුව, බදුල්ල පාර, මාපකඩ වැව. |
| 04. | මඩකලපුව | ජේ. නෙල්සන් මහතා | දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ත නිළධාරී, දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති කාර්යාලය, කච්චෙරිය, මඩකලපුව. |
| 05. | කොළඹ | ටී. එම්. ජයරත්න මහතා | ජලජීවී වගා ව්‍යාප්ති නිළධාරී, දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති කාර්යාලය, නො. 41/1, නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල. |
| 06. | ගම්පහ | ජේ. ආර්. ඩී. සම්පත් මහතා | දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති නිළධාරී, දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති කාර්යාලය, කච්චේරිය සංකීර්ණය, ගම්පහ. |
| 07. | ගාල්ල | එන්. එච්. කේ. කීර්තිරත්න මහතා | දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති නිළධාරී(වැ.බ.), දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති කාර්යාලය, ධීවර සංස්ථා ගොඩනැගිල්ල, මාගල්ල, ගාල්ල. |
| 08. | හම්බන්තොට | ජී. එම්. ඒ. ජී. චන්ද්‍රරත්න මහතා | දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති නිළධාරී, දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති කාර්යාලය, අගුණවැව, කට්ටකඩුව, රන්න. |
| 09. | කළුතර | එච්. එස්. ඩබ්. ඒ. ලියනගේ මහතා | ප්‍රාදේශීය ජලජීවී වගා ව්‍යාප්ති නිළධාරී, දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති කාර්යාලය, නො. 294, වීරරත්න ගොඩනැගිල්ල, ගාලු පාර, කළුතර උතුර. |
| 10. | මහනුවර | ජේ. ඩී. චන්ද්‍රදාස මහතා | දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති නිළධාරී(වැ.බ.), දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති කාර්යාලය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර. |
| 11. | කෑගල්ල | කේ. පී. අයි. පී. කේ. කෝරලේගම මහතා | දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ත නිළධාරී, දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති කාර්යාලය, නො. 193/1/1, බණ්ඩාරනායක මාවත, කෑගල්ල. |
| 12. | කුරුණෑගල | ජේ. එම්. ජේ. සෙනරත් මහතා | දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති නිළධාරී, දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති කාර්යාලය, බිංගිරිය. |
| 13. | කිළිනොච්චි/ මන්නාරම | කේ. නිතිලන් මහතා | දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති නිළධාරී, දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති කාර්යාලය, A-9 පාර, කිළිනොච්චිය. |
| 14. | මාතලේ | අයි. එස්. කේ. ටී. ජයවර්ධන මහතා | දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති නිළධාරී, දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති කාර්යාලය, ඉබ්බන්කටුව, දඹුල්ල. |
| 15. | මාතර | කේ. ඩී. සංජීව මහතා | දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති නිළධාරී, දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති කාර්යාලය, කුරුදුවත්ත පාර, එළියකන්ද, මාතර. |
| 16. | මොණරාගල | කේ. එම්. කපිල බණ්ඩාර මහතා | දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති නිළධාරී, දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති කාර්යාලය, සිරි විජයපුර පාර, මොණරාගල. |

17. නුවරඑළිය — මදුරංග වී. සමරකෝන් මහතා — දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති නිළධාරී(වැ.බ), දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති කාර්යාලය, කච්චේරිය, නුවරඑළිය.

18. පොළොන්නරුව — ඒ. ඒ. පී. ආතාවුද මහතා — දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති නිළධාරී(වැ.බ), දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති කාර්යාලය, නව නගරය, පොළොන්නරුව.

19. රත්නපුර — කේ. එච්. ඒ. එම්. දයානන්ද මහතා — දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති නිළධාරී, ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානය, (තිලාපියා), උඩවලව.

20. පුත්තලම — ඒ. එච්. එම්. විමලරත්න මහතා — දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති නිළධාරී, දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති කාර්යාලය, තානායම පාර, බත්තුළුඔය.

21. ත්‍රිකුණාමලය — ජී. ඒ. යු. ආර්. ගනේපොල මහතා — දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති නිළධාරී, දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති කාර්යාලය, දිස්ත්‍රික් ලේකම්.කාර්යාලය, ත්‍රිකුණාමලය.

22. වව්නියාව — වයි. නිශාන්තම් මහතා — දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති නිළධාරී, දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති කාර්යාලය, කච්චේරිය, වව්නියාව.

### ❖ මිරිදිය ඉස්සන් අභිජනන මධ්‍යස්ථාන

1. පම්බල, මිරිදිය ඉස්සන් අභිජනන මධ්‍යස්ථානය — බී. එම්. පී. ක්‍රිශාන්ත මහතා — ස්ථානභාර නිලධාරී, මිරිදිය ඉස්සන් අභිජනන මධ්‍යස්ථානය, පම්බල, කාක්කපල්ලිය.

2. කහදමෝදර, මිරිදිය ඉස්සන් අභිජනන මධ්‍යස්ථානය — එස්. එච්. ඒ. සිරිකුමාර මහතා — සහකාර අධ්‍යක්ෂ (මිරිදිය), මිරිදිය ඉස්සන් අභිජනන මධ්‍යස්ථානය, තිල්ලවටවන, කහදමෝදර, රන්න.

3. කල්ලරාව, මිරිදිය ඉස්සන් අභිජනන මධ්‍යස්ථානය — ඩබ්. කේ. පී. ප්‍රියන්ත මහතා — ස්ථානභාර නිලධාරී, මිරිදිය ඉස්සන් අභිජනන මධ්‍යස්ථානය, කල්ලරාව.

### ❖ විසිතුරු මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන

4. ගිනිගත්හේන, විසිතුරු මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානය — එස්. ආර්. ඩී. බණ්ඩාර මහතා — ස්ථානභාර නිලධාරී, විසිතුරු මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානය, අඹගමුව, උඩබුලත්ගමුව.

5. රම්බඩගල්ල, විසිතුරු මත්ස්‍ය අභිජනන සහ පුහුණු මධ්‍යස්ථානය — රොහාන් මහතා — ස්ථානභාර නිලධාරී, විසිතුරු මත්ස්‍ය අභිජනන සහ පුහුණු මධ්‍යස්ථානය, රම්බඩගල්ල, පානගමුව.

### ❖ වෙරළබඩ ජලජීවී වගා ව්‍යාප්ති හා අධීක්ෂණ ඒකක

6. බත්තුළුඔය, වෙරළබඩ ජලජීවී වගා ව්‍යාපෘති හා අධීක්ෂණ ඒකකය — ජේ. ඒ. සමින්ද මහතා — සහකාර අධ්‍යක්ෂ, වෙරළබඩ ජලජීවී වගා ව්‍යාපෘති හා අධීක්ෂණ ඒකකය තානායම පාර, බත්තුළුඔය.

7. මඩකලපුව, වෙරළබඩ ජලජීවී වගා ව්‍යාපෘති හා අධීක්ෂණ ඒකකය — එස්. රවිකුමාර් මහතා — සහකාර අධ්‍යක්ෂ, වෙරළබඩ ජලජීවී වගා ව්‍යාපෘති හා අධීක්ෂණ ඒකකය වෙරළ පාර, පුදුකුඩිරිප්පු, මඩකලපුව.

8. කිලිනොච්චි, වෙරළබඩ ජලජීවී වගා ව්‍යාපෘති හා අධීක්ෂණ ඒකකය — බී. නිරුපරාජ් මහතා — සහකාර අධ්‍යක්ෂ, වෙරළබඩ ජලජීවී වගා ව්‍යාපෘති හා අධීක්ෂණ ඒකකය 155, සැතපුම් කණුව, A9 පාර, කිලිනොච්චි.

### ❖ බහු විශේෂ කරදිය වරල් මත්ස්‍ය අභිජනනාගාරය

9. මඩකලපුව, බහු විශේෂ කරදිය වරල් මත්ස්‍ය අභිජනනාගාරය — ඊ. එම්. බුද්ධික මහතා — ස්ථානභාර නිලධාරී, බහු විශේෂ කරදිය වරල් මත්ස්‍ය අභිජනනාගාරය ධර්මපුරම්, කිරින්කුලම් , මඩකලපුව.

# 2. RTI - තොරතුරු දැනගැනීමේ පනත

පහත සදහන් තොරතුරු නිළධාරින් 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනිමේ පනත යටතේ ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (NAQDA) මගින් පත්කරන ලදි.

| නිළධාරි | ලිපිනය | දු. ක. අංකය | විද්‍යුත් ලිපිනය |
|---|---|---|---|
| 1. ආචාර්ය ජේ. එම්. අසෝකා මිය. | ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය, නො. 41/1, නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල. | 0714397722<br>0112786578 | directorcad@naqda.gov.lk |
| 2. එච්. එම්. යු. කේ. පී. බී. හේරත් මයා | | 0714397798<br>0112786494 | directorfw@naqda.gov.lk |
| 3. කේ. බී. සී. පුෂ්පලතා මිය | | 0718661416<br>0112786579 | directorext@naqda.gov.lk |
| 4. ඩබ්ලිව්. එම්. අයි. විජේසේකර මයා | | 0719362755<br>0112786493 | adhr@naqda.gov.lk |
| 5. කේ. එන්. ඒ. දිසානායක මයා | | 0758293773<br>0112786575 | directorfinance@naqda.gov.lk |

# 3. දැක්ම හා මෙහෙවර

## දැක්ම

ජලජීවී වගාව සහ මිරිදිය ධීවර කර්මාන්තයෙහි තිරසාර සංවර්ධනය සහ කලමණාකාරිත්වය තුළින් ජනතාවගේ ආහාර සුරෂිතතාවය සහ ජීවන තත්ත්වය උසස් කිරීමේ ප්‍රමුඛතම ආයතනය බවට පත් වීම.



## මෙහෙවර

**කුඩා, මධ්‍යම සහ විශාල පරිමාණ ජලජීවී ව්‍යවසායන් සංවර්ධනය දිරිමත් කිරීම හා චිරස්ථායී ලෙස ජලජ සම්පත් කළමනාකරණය තුලින් මිරිදිය හා කිවුල්දිය මසුන් සුලභ කිරීමට පහසුකම් සැලසීමෙන් ග්‍රාමීය සමාජයේ දුප්පත්කම තුරන් කිරීම සහ සමාජ ආර්ථික තත්ත්වයන් දියුණු කිරීමට දායක වීම.**



# 4. කාර්ය සාධනය ඇගයීම

## මිරිදිය හා ජලජීවි මත්ස්‍ය නිෂ්පාදනය මෙ.ටොන්



| | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|---|---|---|
| මිරිදිය හා ජලජීවි මත්ස්‍ය නිෂ්පාදනය | 52,410 | 59,560 | 68,950 | 66,910 | 75,750 | 67,300 | 73,930 | |

වර්ෂය

## මත්ස්‍ය ඇගිල්ලන් හා මිරිදිය ඉස්සන් පසුකීටයන් තැන්පත් කිරීම - මිලියන



| | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|---|---|
| මිරිදිය ඉස්සන් පසුකීටයන් | 12 | 11 | 15 | 20 | 10 | 22 | 38 |
| මත්ස්‍ය ඇඟිල්ලන් | 34 | 45 | 37 | 49 | 39 | 54 | 66 |

වර්ෂය

## ඇගිල්ලන් නිෂ්පාදනය මිලියන



| | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|---|---|
| කුඩා පරිමාණ මත්ස්‍ය බිජ නිෂ්පාදන ඒකක | 8 | 8 | 6 | 6 | 4 | 7 | 10 |
| ජලජීවි වගා සංවර්ධන මධ්‍යස්ථාන | 14 | 20 | 21 | 35 | 31 | 40 | 37 |
| පෞද්ගලික පොකුණු | 12 | 15 | 10 | 8 | 5 | 6 | 4 |
| කූඩු/කොටු | 1 | 1 | 1 | 0 | 1 | 2 | 18 |
| එකතුව | 35 | 45 | 37 | 49 | 41 | 55 | 70 |

වර්ෂය

## ඇසිත්තන් නිෂ්පාදනය හා බෙදාහැරීම මිලියන



| | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|---|---|
| කුඩා පරිමාණ මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකක සඳහා | 16 | 18 | 11 | 13 | 7 | 12 | 16 |
| ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානවල ඇඟිල්ලන් නිෂ්පාදනය සඳහා | 16 | 29 | 40 | 63 | 55 | 51 | 58 |
| පෞද්ගලික පොකුණු සඳහා | 26 | 35 | 24 | 22 | 12 | 16 | 9 |
| කූඩු / කොටු සඳහා | 2 | 2 | 1 | 1 | 2 | 10 | 30 |
| එකතුව | 61 | 83 | 76 | 98 | 76 | 88 | 112 |

වර්ෂය

## පසු කීටයන් නිෂ්පාදනය මිලියන



| | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|---|---|
| පසු කීටයන් නිෂ්පාදනය | 93 | 127 | 146 | 149 | 116 | 116 | 137 |

වර්ෂය

## කිවුල්දිය ඉස්සන් අපනයන ප්‍රමාණය හා වටිනාකම




| | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|---|---|
| කිවුල්දිය ඉස්සන් අපනයන ප්‍රමාණය-මෙ.ටොන් | 1,262 | 1,380 | 1,056 | 1,625 | 2,001 | 1,341 | 1,667 |
| කිවුල්දිය ඉස්සන් අපනයන වටිනාකම - රු.මිලියන | 1,521 | 1,799 | 1,618 | 2,521 | 3,375 | 1,971 | 2,464 |

වර්ෂය

## විසිතුරු මත්ස්‍ය අපනයන වටිනාකම රු. මිලියන




| | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|---|---|
| විසිතුරු මත්ස්‍ය අපනයන වටිනාකම-රු.මිලියන | 920 | 1,112 | 865 | 1,383 | 1,636 | 2,392 | 1,847 |

වර්ෂය

## ආදායම් වර්ධනය රු. '000




| | 1999 | 2000 | 2001 | 2002 | 2003 | 2004 | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් | 920 | 2,198 | 1,804 | 3,110 | 2,852 | 5,767 | 5,649 | 10,310 | 5,924 | 4,884 | 7,406 | 27,505 | 37,363 | 42,377 | 56,295 | 57,134 | 95,585 | 105,254 |

වර්ෂය

## වෙනත් ආදායම් රු. '000




| | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 | 18 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| වෙනත් ආදායම් | - | - | - | - | - | 8,771 | 9,161 | 46,051 | 36,074 | 55,052 | 69,951 | 41,082 | 26,508 | 39,371 | 43,076 | 43,320 | 51,942 | 58,896 |

වර්ෂය

## භාණ්ඩාගාර දායකත්වය රු. මිලි




| | 1999 | 2000 | 2001 | 2002 | 2003 | 2004 | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භාණ්ඩාගාර ප්‍රදාන- පුනරාවර්තන වියදම් | | | | | | | | | 45 | 67 | 50 | 50 | 60 | 91 | 90 | 95 | 100 | 150 |
| භාණ්ඩාගාර ප්‍රදාන - ප්‍රාග්ධන වියදම් | 24 | 36 | 39 | 40 | 37 | 42 | 55 | 81 | 118 | 136 | 154 | 161 | 171 | 179 | 208 | 215 | 313 | 340 |

වර්ෂය

## ලාභදායිත්වය දෙසට රු. මිලි




| වර්ෂය | 1999 | 2000 | 2001 | 2002 | 2003 | 2004 | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ශුද්ධ ලාභය | 920 | 2,198 | (14,265) | (12,923) | (3,398) | (27,795) | (7,986) | (34,403) | (42,168) | (53,597) | (67,996) | (40,318) | (28,955) | (14,216) | (16,969) | (3,171) | 12,582 | 312 |

වර්ෂය

## පරිපාලන වියදම් රු. '000




| වර්ෂය | 1999 | 2000 | 2001 | 2002 | 2003 | 2004 | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පරිපාලන වියදම් | 34,947 | 46,670 | 39,522 | 42,906 | 49,772 | 55,343 | 82,820 | 96,574 | 128,424 | 157,614 | 168,344 | 189,075 | 212,826 | 237,040 | 264,473 | 297,410 | 389,847 | 453,323 |

වර්ෂය

## වත්කම් පදනම රු. '000




| වර්ෂය | 1999 | 2000 | 2001 | 2002 | 2003 | 2004 | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජංගම වත්කම් | 1,172 | 3,323 | 9,458 | 10,835 | 16,816 | 29,935 | 20,081 | 28,034 | 42,278 | 60,707 | 66,046 | 67,949 | 63,645 | 49,330 | 59,572 | 75,395 | 145,207 | 195,536 |
| කෙරීගෙන යන වැඩ | 90,704 | 100,266 | 44,960 | 49,316 | 20,428 | 25,301 | 43,115 | 84,631 | 67,108 | 63,134 | 58,167 | 43,679 | 43,679 | 78,375 | 43,679 | 47,187 | 17,463 | 55,821 |
| ස්ථාවර වත්කම් | 242,248 | 237,682 | 331,650 | 318,194 | 353,849 | 335,131 | 339,379 | 335,777 | 384,653 | 387,067 | 632,512 | 706,939 | 715,823 | 707,418 | 751,487 | 764,024 | 1,109,244 | 1,096,582 |
| මුළු වත්කම් | 334,124 | 341,271 | 386,067 | 378,345 | 391,094 | 390,367 | 402,575 | 448,442 | 494,038 | 510,907 | 756,725 | 818,566 | 823,147 | 835,124 | 854,738 | 886,606 | 1,271,913 | 1,347,938 |

වර්ෂය

## 2015 හිමිකම් හා වගකීම් රු. '000




## 2016 හිමිකම් හා වගකීම් රු. '000




## 2016 වසර තුළ ක්‍රියාත්මක කරන ලද විශේෂ ව්‍යාපෘති



# 5. සභාපතිතුමාගේ පණිවුඩය

**2016 වසර සඳහා ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ (නැක්ඩා) වාර්ෂික වාර්තාව**

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ (නැක්ඩා) වාර්ෂික වාර්තාව සහ අවසන් ගිණුම් වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව අතිශයින්ම සතුටට පත් වෙමි.

ශ්‍රී ලංකාවේ බහුලව පිහිටා ඇති ජලාශ, ගංගා සහ විල්ලු වැනි ජල මූලාශ්‍ර මගින් සශ්‍රීකත්වයට පත් ව ඇති මිරිදිය ධීවර කර්මාන්තය සහ ජලජීවී වගා අංශය අප දිවයිනේ ආර්ථික සංවර්ධනය උදෙසා ලැබී ඇති අමිල වත්කමකි. අනාදිමත් කාලයක සිට, අප දිවයිනේ වියළි කලාපීය ප්‍රදේශවල මූලිකව පිහිටි ප්‍රත්‍යන්ත ප්‍රදේශවල වාරි ජලාශ ආශ්‍රිතව දිවි ගෙවූ ජනයාගේ එක් ප්‍රධානම ජීවනෝපාය සහ ආර්ථික ක්‍රියාකාරකමක් බවට මිරිදිය ධීවර කර්මාන්තය පත් ව තිබුණි. වර්තමානයේ දී පුද්ගලයන් 54,000 කට පමණ මෙම අංශය මගින් ඍජු රැකියා අවස්ථා සපයා ඇති අතර තවත් විශාල පිරිසක් ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම්වල නිරතව සිටිති. මෑත කාලීනව, වෙනත් ජලජීවී වගාව මෙන්ම මත්ස්‍ය වගාවන් ද අප දිවයින වෙත විදේශ විනිමය ඉපයීම සම්බන්ධයෙන් වඩාත් ප්‍රබල දායකත්වයක් දක්වන ක්ෂේත්‍රයක් ලෙස මෙම අංශය ඉස්මතු වී තිබේ.

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (නැක්ඩා) 1999 වසරේ දී, 1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරි පනතේ විධිවිධාන යටතේ ස්ථාපනය කරන ලද අතර ශ්‍රී ලංකාවේ ජලජීවී වගාව සහ මිරිදිය ධීවර කර්මාන්තය සංවර්ධන කිරීම සහ කළමනාකරණය කිරීම පිළිබඳව සහ ඒ සම්බන්ධ කටයුතු ඉටු කිරීම පිළිබඳ වගකීම මෙම අධිකාරිය වෙත පැවරී තිබේ. මෙම අධිකාරිය ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ක්‍රියාත්මක වන අතර අධිකාරියේ මූලික කර්තව්‍යයන් පහත දක්වා ඇත.

- අභ්‍යන්තර ජලාශවල වගා කිරීම සඳහා සුදුසු මත්ස්‍ය විශේෂ හඳුනා ගැනීම;
- අභිජනන ක්‍රම සංවර්ධනය කිරීම සහ තාක්ෂණික ක්‍රම හඳුන්වා දීම;
- මත්ස්‍ය බීජ නිෂ්පාදනය ඉහළ නැංවීම;
- විද්‍යාත්මක ක්‍රම අනුගමනය කිරීම තුළින් මිරිදිය ධීවර කර්මාන්තය කළමනාකරණය කිරීම;
- ජලජීවී වගා අංශයේ කුඩා, මධ්‍යම සහ විශාල පරිමාණ පුද්ගලික/රාජ්‍ය අංශයට අයත් ව්‍යවසාය ස්ථාපනය කිරීම සඳහා පහසුකම් සැලසීම සහ ඒවා ප්‍රවර්ධනය කිරීම;
- ඉස්සන් වගාව ප්‍රවර්ධනය කිරීම සහ නියාමනය කිරීම;
- විසිතුරු මත්ස්‍ය කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සහ නියාමනය කිරීම;
- මුහුදු මත්ස්‍ය වගාව, කකුළුවන් වගාව, මුහුදු කුඩැල්ලන් වගාව, බෙල්ලන් වගාව, මුහුදු පැළෑටි වගාව ආදි නව ජලජීවී වගා ක්‍රම හඳුන්වා දීම;

එයට අමතරව, ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (නැක්ඩා) මගින් අවශ්‍ය පුහුණුව ලබා දීම, තාක්ෂණය හුවමාරු කර ගැනීම, ව්‍යාප්ති සේවා ලබා දීම මෙන්ම පාර්ශ්වකරුවන් අතර සම්බන්ධතා ඇති කර ගැනීම තුළින් මිරිදිය ධීවර සංවිධානවල සහ ජලජීවී වගා සංවිධානවල ධාරිතාව ඉහළ නැංවීම සඳහා කටයුතු සිදු කර තිබේ. එමෙන්ම, මිරිදිය ධීවර කර්මාන්තය සහ ජලජීවී වගාවේ තිරසාර සංවර්ධනය තහවුරු කිරීම උදෙසා පරිසර හිතකාමී මෙන්ම සමාජීය වශයෙන් පිළිගත හැකි විශිෂ්ඨතම කළමනාකරණ පරිචයන් අනුගමනය කිරීම තුළින් දැනට පවතින ජලජ සම්පත් තිරසාරව භාවිත කිරීම පිළිබඳව ද ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය නිසි අවධානය යොමු කර ඇත.

- ග්‍රාමීය ප්‍රජාව අතර ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම සහ මිරිදිය මත්ස්‍ය නිෂ්පාදන සාධාරණ මිලකට ලබා දීම මගින් ග්‍රාමීය ජනතාවගේ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම.

- ග්‍රාමීය ජනගහනය සඳහා රැකියා අවස්ථා උත්පාදනය කිරීම සඳහා ද මෙමගින් දායකත්වයක් ලබා දෙන අතර දළ දේශීය නිෂ්පාදිතය ඉහළ නැංවීම සඳහා දායකත්වය ලබා දීම මගින් ග්‍රාමීය ආර්ථිකය සවිබල ගැන්වීම. 2016 වර්ෂයේ දී මිරිදිය සහ ජලජීවී වගා නිෂ්පාදනයේ තක්සේරු කළ වටිනාකම දළ වශයෙන් රු. බිලියන 16.34 ක් වූ අතර එමගින් ජාතික ආර්ථික වර්ධනය සඳහා ග්‍රාමීය අංශයෙන් කැපී පෙනෙන දායකත්වයක් ලබා දී ඇත.

- විදේශීය රටවල ඉහළ ඉල්ලුමක් පවතින විවිධ ජලජීවී නිෂ්පාදනයන්ට උදාහරණ ලෙස සර්ම කලාපික විසිතුරු මත්ස්‍යයන්, ඉස්සන්, කකුළුවන්, මුහුදු කුඩැල්ලන්, මුහුදු පැළෑටි සහ වෙනත් ජලජීවී වගා නිෂ්පාදන අපනයනය කිරීම තුළින් විදේශ විනිමය ඉපයීම සඳහා ශ්‍රී ලාංකිකයන්ට අවස්ථාව උදා වේ. 2016 වර්ෂය තුළ, ප්‍රධාන වශයෙන්ම ඉස්සන් සහ විසිතුරු මත්ස්‍යයන් අපනයනය කිරීම තුළින් රු. මිලියන 4,311 ක විදේශ විනිමය උපයා ගැනීමට හැකියාව ලැබුණි.

එම නිසා, මිරිදිය ධීවර කර්මාන්තය සහ ජලජීවී වගා කටයුතු ප්‍රවර්ධනය කිරීම තුළින් ශ්‍රී ලාංකිකයන්ට වඩාත් සැළකිය යුතු සමාජීය සහ ආර්ථික ප්‍රතිඵල භුක්ති විඳිය හැකි වනු ඇත.

2016 වර්ෂයේ දී, මිරිදිය සහ ජලජීවී වගා නිෂ්පාදනය ටොන් 73,930 ක් වූ අතර එම නිෂ්පාදන මට්ටම 2015 වර්ෂයේ නිෂ්පාදන මට්ටමට වඩා 10% කින් ඉහළ වර්ධන ප්‍රතිශතයක් අත්පත් කර ගෙන තිබුණි. ප්‍රජා සහභාගීත්වය තුළින් ජලාශ නිසි පරිදි කළමනාකරණය කිරීම, ප්‍රජා මූලික කුඩා පරිමාණ මත්ස්‍ය බීජ නිෂ්පාදන මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම, මත්ස්‍ය බීජ නිෂ්පාදනය ඉහළ නැංවීම සහ මත්ස්‍ය ඇඟිල්ලන් නිකුත් කිරීමේ දී සහ බෝට්ටු සහ මසුන් ඇල්ලීම සඳහා යොදා ගන්නා ආම්පන්න බෙදා හැරීමේ දී ද, ධීවරයන්ගේ කුසලතා සංවර්ධනය කිරීමේ දී සහන පදනම මත යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම ඇතුළු වැදගත් ධීවර වැඩසටහන් විශාල සංඛ්‍යාවක් ක්‍රියාත්මක කළ බැවින් 2016 වර්ෂයේ දී මෙම අංශයෙන් ඉහළ කාර්ය සාධනයක් අත්පත් කර ගැනීමට හැකි විය.

"සුදු පුල්ලි" රෝගය හේතු කොට ගෙන විනාශයට පත් වූ ඉස්සන් වගා කර්මාන්තය වර්තමානයේ දී, පූර්වයෙන් පැවති නිෂ්පාදන ධාරිතාවට ළඟා වී ඇති බව සැලකිල්ලට ගත යුතු වැදගත් කරුණක් වන අතර ඉස්සන් වගාව ක්‍රමයෙන් මඩකලපුව දිස්ත්‍රික්කය තුළ ද ව්‍යාප්ත වෙමින් පවතී. සම්ප්‍රදායික නොවන ජලජීවී වගා ක්‍රියාකාරකම්වල නිරත වීමට කුඩා පරිමාණ ව්‍යවසායකයන් තුළ නැඹුරුතාවක් වර්ධනය වෙමින් පවතින බව සඳහන් කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව සතුටට පත් වෙමි. මුහුදු කුඩැල්ලන් වගා කිරීම සහ මුහුදු පැළෑටි වගාව පිළිබඳ තාක්ෂණික ක්‍රම හඳුන්වා දීම සහ නියමු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (නැක්ඩා) ප්‍රයත්න දැරීම හේතු කොට ගෙන ඉදිරි වසරවල දී, මුහුදු කුඩැල්ලන් සහ මුහුද පැළෑටි වගාවේ සැලකිය යුතු වර්ධනයක් අපේක්ෂා කළ හැකිය. ප්‍රමුඛ පෙළේ සමාගමක් මගින් මුහුදු පැළෑටි නිෂ්පාදන අපනයනය කිරීම ඉලක්ක කර ගනිමින් ප්‍රජා සහභාගීත්වය යටතේ මුහුදු පැළෑටි වගා කිරීම ආරම්භ කර තිබේ. මෝදා මත්ස්‍යයන් (සී බාස්) කූඩුවල වගා කිරීමත් සමග මුහුදු මත්ස්‍ය වගාව ආයෝජකයන් අතර වඩාත් ජනප්‍රිය වෙමින් පවතී. ඇතැම් සමාජීය සහ සංස්කෘතික බාධක ක්‍රම ක්‍රමයෙන් මැඬපවත්වාලමින් ආහාරයට ගැනීම සඳහා පොකුණුවල කුඩා පරිමාණයෙන් මත්ස්‍යයන් වගා කිරීමේ කටයුතු වර්ධනය වෙමින් පැවතීම, ජලජීවී වගා ක්ෂේත්‍රයේ වඩාත් හිතකර සහ දිරිගන්වන සුළු ප්‍රවණතාවක් බවට පත් වී ඇත. වගා කරනු ලබන මත්ස්‍ය විශේෂ පරාසය පුළුල් කිරීම සහ අපනයනය සඳහා යෝග්‍ය තත්ත්වයට ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමත් සමග විසිතුරු මත්ස්‍ය වගාව ශීඝ්‍රයෙන් පුළුල් වෙමින් පවතී. නිෂ්පාදකයන්ගේ සහ අපනයනකරුවන්ගේ අරමුණු අතර සම්බන්ධීකරණයක් ඇති කරමින් ඔවුන්ගේ වෙළඳපොළ සකස් කර ගැනීම තුළින් එම පාර්ශ්වයන් සඳහා අන්‍යෝන්‍ය ප්‍රතිලාභ ලැබීම සහතික කිරීම ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ (නැක්ඩා) අභිප්‍රායයි.

පහත දක්වා ඇති වැඩසටහන් වලින් ලැබුණු ප්‍රතිලාභ පිළිබඳව විශේෂයෙන් සඳහන් කිරීම අවශ්‍ය යයි සිතිමි.

- ජලාශ අවට පදිංචිව සිටින ධීවරයන්ගේ සමාජීය සහ ආර්ථික සංවර්ධනය ඉහළ නැංවීම සඳහා මෙන්ම නව රැකියා උත්පාදනය කිරීම තුළින් ඔවුන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සඳහා ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය මගින් ආරම්භ කරන ලද "වැවක් සමග ගමක්" වැඩසටහන ක්‍රියාත්මක කිරීම තුළින් සතුටුදායක ප්‍රගතියක් ළගා කර ගැනීමට සමත්ව තිබේ. මෙම වැඩසටහන යටතේ ග්‍රාමීය මට්ටමේ යටිතල පහසුකම් සංවර්ධන කටයුතු ද සිදු වෙමින් පවතී.

- ජනාධිපති ලේකම් කාර්යාලය මගින් ආරම්භ කරන ලද "පිබිදෙමු පොළොන්නරුව" වැඩසටහන යටතේ පොළොන්නරුවේ මත්ස්‍ය අභිජනනාගාරයක් සහ දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති කාර්යාලයක් ස්ථාපනය කිරීමේ කටයුතු ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (නැක්ඩා) මගින් ආරම්භ කර තිබේ.

- ගුණාත්මක ආහාර භාවිත කරමින් ස්වයංපෝෂිත තත්ත්වයට පත් වීම සඳහා ජනාධිපති ලේකම් කාර්යාලය මගින් ආරම්භ කරන ලද "ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන 2016 2018" යටතේ නව අභිජනන මධ්‍යස්ථාන සහ අභිජනනාගාර ස්ථාපනය කිරීම, පවතින මධ්‍යස්ථානවල පහසුකම් පුළුල් කිරීම, මත්ස්‍ය ඇඟිල්ලන් ජලාශ තුළ තැන්පත් කිරීම, වතු ආශ්‍රිත ජලජීවී වගාව ප්‍රවර්ධනය කිරීම ආදී ක්‍රියාකාරකම් රැසක් ආරම්භ කර තිබේ.

## ක්‍රමෝපායික අරමුණු සහ අනාගත අපේක්ෂා

2016 වසරේ ජාතික ඒක පුද්ගල දෛනික මත්ස්‍ය පරිභෝජනය ග්‍රෑම් 43.4 ක් වූ අතර මිරිදිය ධීවර කර්මාන්තයෙන් සහ ජලජීවී වගාවෙන් ලැබෙන දායකත්වය ඉහළ නැංවීම තුළින් දෛනික පරිභෝජනය ඉහළ නැංවීම අපගේ අපේක්ෂාව වන අතර ඒ අනුව, නිර්දේශිත දෛනික මත්ස්‍ය පරිභෝජන මට්ටම වන ග්‍රෑම් 60 දක්වා පරිභෝජන මට්ටම ඉහළ නැංවීම සඳහා මිරිදිය ධීවර කර්මාන්තයෙන් සහ ජලජීවී වගාවෙන් ලැබෙන දායකත්වය ඉහළ නැංවීම අපගේ ඉලක්කය බවට පත් වී ඇත.

2020 වසර වන විට, මිරිදිය ධීවර කර්මාන්තයෙන් සහ ජලජීවී වගාවෙන් ලබා ගන්නා නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 130,000 දක්වා ඉහළ නංවීම සඳහා මෙන්ම අමතර ඍජු සහ වක්‍ර රැකියා අවස්ථා 40,000 ක් උත්පාදනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (නැක්ඩා) වැදගත් පියවර රැසක් ක්‍රියාත්මක කර තිබේ. සියලුම මිරිදිය ජලාශ භාවිත කර ඵලදායි අන්දමින් මත්ස්‍ය නිෂ්පාදනය සිදු කිරීම සඳහා මත්ස්‍ය ඇඟිල්ලන් මිලියන 300 ක් පමණ අවශ්‍ය වන බව තක්සේරු කර ඇති අතර වසරකට මත්ස්‍ය ඇඟිල්ලන් මිලියන 70 ක් පමණ දැනට නිෂ්පාදනය කරනු ලබයි. පවතින මධ්‍යස්ථාන අළුත්වැඩියා කිරීම සහ පුළුල් කිරීම තුළින් එම මධ්‍යස්ථානවල මත්ස්‍ය අභිජනන ධාරිතාව වැඩි දියුණු කිරීම, නව අභිජනන මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම, කුඩා පරිමාණ මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකක, පෞද්ගලික පොකුණු සහ මත්ස්‍ය කුඩු ස්ථාපනය කිරීම, ජල පාදක අභිජනනාගාර ස්ථාපනය කිරීම වැනි ක්‍රියාකාරකම් මාලාවක් තුළින් මත්ස්‍ය ඇඟිල්ලන් වැඩි සංඛ්‍යාවක් නිෂ්පාදනය කිරීමට සැලසුම් සකස් කර තිබේ. ජලාශ කොටු තුළට ඇඟිල්ලන් වෙනුවට ඇසිත්තන් නිදහස් කිරීමේ වැඩසටහනක් ද හඳුන්වා දීමට ද අපි කටයුතු පිළියෙළ කළෙමු. එම නිසා මසුන් පැටවුන් වර්ධනය කිරීමට අවශ්‍ය අමතර ඉඩකඩ ප්‍රමාණයක් ලැබුනි. 2018 වසර වන විට, තැන්පත් කරන ඇඟිල්ලන් ප්‍රමාණය මිලියන 100 දක්වා වැඩි වනු ඇතැයි ද, එමගින් ධීවරයන්ගේ/ ගොවීන්ගේ මුදල් ඉපයීමේ ධාරිතාව ඉහළ නගිනු ඇතැයි ද අපි අපේක්ෂා කරමු. පහත බසින ලද ආනයන තුළින් වැඩි වූ විදේශ විනිමය ඉතිරි කිරීම්වලට අමතරව, මෙමගින් ද අප දිවයිනට අමතර ආදායමක් ලැබෙනු ඇත.

කහඳමෝදර සහ පම්බල මිරිදිය ඉස්සන් අභිජනනාගාරවල ධාරිතාව පුළුල් කිරීම සහ ත්‍රිකුණාමලයේ නව අභිජනනාගාරයක් ස්ථාපනය කිරීමත් සමග මිරිදිය ඉස්සන් පසු කීටයන් නිෂ්පාදනය වර්තමාන නිෂ්පාදනය මෙන් තෙගුණයකින් ඉහළ නැංවීමට ද එම නිෂ්පාදනය මිලියන 120 ක් දක්වා වර්ධනය කිරීමට ද අපි අපේක්ෂා කරන්නෙමු. එමඟින්, රු. මිලියන 1,500 ක විදේශ විනිමය උපයා ගැනීමට අපට හැකියාව ලැබෙනු ඇත.

වර්ෂය මුළුල්ලේ ජලයෙන් පිරී පවත්නා ජලාශවල සහ කාලීන ජලාශවල වගා පාදක ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා මෙන්ම ඉහළ වටිනාකමකින් යුත් මත්ස්‍ය විශේෂ ජලාශවල තැන්පත් කිරීම ප්‍රවර්ධනය සඳහා ද මෙම වැඩසටහන අඛණ්ඩව පවත්වා ගෙන යෑමට සියලු පියවර ගනු ලැබේ. සංස්කෘතිය පදනම් වූ ධීවර කර්මාන්තය කළමනාකරණය සඳහා සහාය ලබා ගැනීමේ අරමුණින් ග්‍රාමීය ධීවර කර්මාන්ත සංවිධාන ආරම්භ කිරීමට ද අපි කටයුතු කළෙමු. එක් එක් මාළු කිලෝග්‍රෑමයක් සඳහා රු. 20/ ක දායකත්වයක් ලබා දෙමින් අවම කාල සීමාවක් තුළ රු. මිලියන 122 ක අරමුදලක් රැස් කර ගැනීමට මෙම සමිතිවලට හැකියාව ලැබුණි. මේ අන්දමින් වැඩි වැඩියෙන් අරමුදල් රැස් කිරීම සඳහා එම සමිති උනන්දු කිරීමට ද, එමගින් ජලාශ වලට මත්ස්‍ය පැටවුන් මිලට ගැනිමේ හැකියාව වැඩි කිරිමට ද රජයේ සහාය ලබා ගෙන යැපීමේ අවශ්‍යතාවෙන් නිදහස් වීමටද ඔවුන්ට මංපෙත් විවර කර දීම අපගේ අපේක්ෂාවයි.
වතුයායවල වාසය කරන ප්‍රජාවගේ පෝෂණ මට්ටම් වැඩි දියුණු කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (නැක්ඩා) මගින් වතු පොකුණුවල ජලජීවී වගා වැඩසටහන් ද මේ වන විට ද ක්‍රියාත්මක කර ඇති අතර සියලුම වතු ජලාශ අළුත්වැඩියා කිරීමට ද තවත් වසර කීපයක් තුළ එම ජලාශවල වගා පාදක ධීවර කර්මාන්තයක් හඳුන්වා දීමට ද අපි අපේක්ෂා කරන්නෙමු.

2016 වර්ෂයේ දී, "ජලජීවී වගා කාර්මාන්තපුර" සහ "වාණිජ ගොවිපල" යන නව සංකල්ප දියත් කිරීමට අපට හැකියාව ලැබුණු අතර ජලජීවී වගා සඳහා ආයෝජනය කිරීම් වැඩි කිරීම සහ අවශ්‍ය යටිතල පහසුකම් ලබා දීම තුළින් පරිසර හානිය වළක්වමින් ආහාර සුරක්ෂිතතා ඉලක්ක සහ ආර්ථික සංවර්ධන ඉලක්ක තිරසාර අන්දමින් සාක්ෂාත් කර ගැනීම සහ වෙරළාශ්‍රිත ජලජීවී වගාව සංවර්ධනය කිරීම සඳහා විභව්‍ය ආයෝජකයන් වෙත යෝග්‍ය වාතාවරණයක් ලබා දීම යන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ඉහත දක්වා ඇති නව සංකල්ප හඳුන්වා දෙන ලදී. මෙම වැඩපිළිවෙළ ස්ථාපනය කිරීම තුළින් ඍජු සහ වක්‍ර රැකියා අවස්ථා ද උත්පාදනය කිරීමට මඟ පැදෙනු ඇත. වෙරළාශ්‍රිතව ජීවත් වන ප්‍රජාවේ ආදායම් මට්ටම සහ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට ද මෙමඟින් හැකි වන අතර වෙරළාශ්‍රිත ජලජීවී වගා නිෂ්පාදනය ඉහළ නැංවීම තුළින් දිවයිනේ ආර්ථික සංවර්ධනය ට ද මංපෙත් විවර වනු ඇත.

සම්ප්‍රදායික නොවන ජලජීවී වගා ක්‍රියාකාරකම් සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් ද අපගේ අවධානය අඛණ්ඩව යොමු කරනු ලබන අතර ජලජීවී වගා නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා මෙන්ම තාක්ෂණික දැනුම ලබා ගැනීමේ අරමුණින් විදේශීය ආයෝජකයන් මෙම අංශය සඳහා වැඩි වැඩියෙන් ආකර්ෂණය කර ගැනීම අපගේ අභිප්‍රායයි. මෙම සියලුම නව්‍ය සංවර්ධන ක්‍රමෝපාය අනුගමනය කිරීම තුළින් ග්‍රාමීය ප්‍රජාවේ පෝෂණ තත්ත්වය වැඩි දියුණු කිරීමට ද, ග්‍රාමීය ආර්ථිකය සවිබල ගැන්වීමට මෙන්ම අපනයන ඉපයීම් ඉහළ නැංවීමට ද අපට හැකියාව ලැබෙනු ඇත.

**ඇගයීම**

ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන හා ග්‍රාමීය ආර්ථික අමාත්‍ය ගරු විජිත් විජයමුණි සොයිසා මැතිතුමා ද, ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන හා ග්‍රාමීය ආර්ථික රාජ්‍ය අමාත්‍ය ගරු දිලිප් වෙදආරච්චි මැතිතුමා ද,ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන හා ග්‍රාමීය ආර්ථික නියෝජ්‍ය අමාත්‍ය ගරු අමීර් අලි ශිහාබ්ඩීන් මැතිතුමා ද, අමාත්‍යාංශ ලේකම්තුමිය ද, රාජ්‍ය ලේකම්තුමා ද, විගණකාධිපතිතුමා සහ ඔහුගේ කාර්ය මණ්ඩලය ද, අදාළ අනෙක් ආයතනවල ප්‍රධානීන් සහ ඔවුන්ගේ කාර්ය මණ්ඩල විසින් ද මා වෙත නිර්ලෝභීව ලබා දුන් සහයෝගය, සහාය සහ මගපෙන්වීම් සම්බන්ධයෙන් මගේ කෘතඥතාව පළ කරමි.

එමෙන්ම, ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ (නැක්ඩා) අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් විසින් මෙම වර්ෂය තුළ මා වෙත අඛණ්ඩව ලබා දුන් නැණවත් මඟපෙන්වීම් සහ සහාය සැබවින්ම අගය කරන අතර අධ්‍යක්ෂ ජනරාල්/ප්‍රධාන විධායක නිලධාරි සහ ඔහුගේ කළමනාකරණ කණ්ඩායම විසින් ඔවුන්ගේ කුසලතා පූර්ණ කළමනාකරණ හැකියාව සහ කැපවීම තුළින් මා වෙත ලබා දුන් විශිෂ්ඨ සහයෝගය සහ දායකත්වය පිළිබඳව විශේෂයෙන් සඳහන් කිරීමට ද මෙය අවස්ථාවක් කර ගනිමි.

**සභාපති**

**නුවන් ප්‍රසන්ත මදවන් ආරච්චි (**B.sc, M.sc, MRDP**)**

# 6. අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

විසිතුරු මත්ස්‍ය හා ජලජ පැළෑටි වගාව ඇතුළුව ජලජීවී වගා හා අභ්‍යන්තර ධීවර කර්මාන්තය ශ්‍රී ලංකාව තුල සංවර්ධන කාර්යෙහිලා රාජ්‍ය වගකීම මෙන්ම බලතල හිමි ප්‍රධානතම රාජ්‍ය ආයතනය ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇති ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියයි.




ජලජීවී වගාකරුවන්ගේ අභිවෘද්ධිය කෙරෙහි අප අධිකාරියේ මූලික අවධානය යොමු වී ඇති අතර ඔවුනගේ මෙන්ම රාජ්‍ය ආදායම ද වැඩිකිරීමට අප අධිකාරිය නොයෙකුත් පියවර ගනිමින් සිටියි.

මිරිදිය හා ජලජීවී වගා මත්ස්‍ය නිෂ්පාදනය සුවිශේෂී වර්ධනයක් පෙන්නුම් කරන අතර එය 2016 වසරේ මෙට්‍රික්ටොන් 73930 කි. එය 2015 වසරට වඩා මෙට්‍රික්ටොන් 6630ක වැඩිවීමකි. ජලාශයන්හි කාර්යක්ෂම කළමනාකාරීත්වයක් ප්‍රජා සහභාගිත්වයෙන් ඇති කිරීම, ප්‍රජා මූලික මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකකයන්හි සාර්ථක ක්‍රියාකාරීත්වය තුලින් මත්ස්‍ය ඇඟිල්ලන් නිෂ්පාදනය වැඩිකිරීම, ජලාශයන්හි මත්ස්‍ය ඇඟිල්ලන් වැඩි ප්‍රමාණයක් තැන්පත් කිරීම වැනි අප අධිකාරිය විසින් ගත් ක්‍රියාමාර්ග මෙම වසරේ මත්ස්‍ය නිෂ්පාදනය වැඩිවීමට හේතු විය.

තවද පුත්තලම, මඩකලපුව යන දිස්ත්‍රික්කයන්හි ප්‍රධානතම වාණිජ්‍යමය ජලජීවී වගාවක් වන කිවුල් දියඉස්සන් වගාව ක්‍රියාත්මක වේ. මෙම වසරේ මෙම දිස්ත්‍රික්කයන්ට ලැබුණු අඩු වර්ෂාපතනය නිසා කලපු තුල ලවණතාව වැඩිවීම, ඉස්සන් පසුකීටයන් නිෂ්පාදනයට අවශ්‍ය ප්‍රමාණවත් ගුණාත්මක තත්වයේ මව් ඉස්සන් නොමැතිවීම, එසේම ඉස්සන් පසුකීටයන්ගේ මුල් අවධියේදීම vibrio බැක්ටීරියා රෝගය ආසාදනයවීම වැනි බාධක ඇති වුවත් 2016 වසරේ මෙට්‍රික්ටොන් 6030 ඉස්සන් නිෂ්පාදනයක් මෙම දිස්ත්‍රික්කවලින් ලබා ගැනීමට හැකි වී ඇත.

2016 වසරේ අප අධිකාරියේ ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන සහ ප්‍රජා මූලික සංවිධාන මගින් ක්‍රියාත්මක වන මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකක සහ පෞද්ගලික පොකුණු මගින් මත්ස්‍ය ඇඟිල්ලන් මිලියන 69.77ක් නිෂ්පාදනය කරන ලදී. මත්ස්‍ය ඇඟිල්ලන් නිෂ්පාදනය තවදුරටත් වැඩිවීම සඳහා බලපෑ හේතුවක් වූයේ ජලාශයන්හි කොටු හා කුඩු තුල ඇසිත්තන් ඇඟිල්ලන් දක්වා වර්ධනය කිරීමේ වැඩසටහන හඳුන්වා දීමයි. එය 2015 වසරටවඩා 26%ක වැඩිවීමකි.

ජලාශ, පොකුණු සහ කලපු තුල මිරිදිය ඉස්සන් පසුකීටයන් තැන්පත් කිරීම පසුගිය වසරට වඩා 68%ක පමණ වැඩිකිරීමක් මෙම වසරේ සිදුවිය. මෙම පසුකීටයන් පම්බල, කහඳමෝදර මිරිදිය ඉස්සන් අභිජනන මධ්‍යස්ථාන වල සහ පුද්ගලික අභිජනනාගාරය මගින් නිෂ්පාදනය කරනු ලැබිණි.

මේ වන විට මිලියන 22ක් පමණ වන මිරිදිය ඉස්සන් පසුකීටයන් නිෂ්පාදනය මිලියන 50 දක්වා වැඩිකිරීමට මේ සියල්ලේම සහය ද අප අධිකාරියට ලැබී ඇත. තවද වාර්ෂිකව මිරිදිය ඉස්සන් පසුකීටයන් මිලියන 25ක නිෂ්පාදන ධාරිතාවක් ඇති මිරිදිය ඉස්සන් අභිජනන මධ්‍යස්ථානයක් සඳහා ඉදිකිරීම් කටයුතු ත්‍රිකුණාමලය




දිස්ත්‍රික්කයේ ආරම්භ කිරීමද මෙම වසරේ සිදුවිය. මිරිදිය ඉස්සන් වගාව තුලින් ජලාශයන්හි ධීවරයින්ට නව ආදායම් මාර්ගයක් ලැබී ඇති අතර අප රටට විදේශීය විනිමය උත්පාදන නව මාර්ගයක්ද එමගින් ආරම්භ වී ඇත. මේ වන විට පෞද්ගලික ආයතන තුනක් මිරිදිය ඉස්සන් අපනයන කාර්යයෙහි නියැලීසිටී.

රාජ්‍ය හා පෞද්ගලික හවුල් ව්‍යවසායක යෝජනා ක්‍රමයක් යටතේ මිරිදිය ඉස්සන් පසු කීටයන් ජලාශ වල තැන්පත් කිරීම මෙන්ම එම නිෂ්පාදනය ඔවුන් විසින් මිළදී ගැනීමේ ක්‍රමවේදයක්ද ආරම්භ කර ඇත. ව්‍යාපාරිකයින් මිරිදිය ඉස්සන් කර්මාන්තයට යොමුකිරීමට අනුබලදීමක් මෙන්ම ජලාශයන්හි මිරිදිය ඉස්සන් පසුකීටයන් තැන්පත් කිරීම වැඩිකිරීමටද එමගින් වැඩි නිෂ්පාදනයක් ලබා ගැනීමට සහ අපනයනය තුලින් අප රටට වැඩි විදේශ විනිමය ප්‍රමාණයක් ලබා ගැනීමටද එමගින් අපේක්ෂා කෙරේ.

වතු කළමනාකාරිත්වයේ සහ ප්‍රජාවගේ ක්‍රියාකාරී සහභාගීත්වය ලබා ගැනීමෙන් වතු ආශ්‍රිතව මත්ස්‍ය නිෂ්පාදන පොකුණු ස්ථාපිත කිරීමට සහයෝගය ලබාදීමට විශේෂ වැඩසටහනක්ද මෙම වසරේ ආරම්භ කරන ලදී. වතු ජනතාවගේ පෝෂණ මට්ටම වැඩිකිරීම මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ වූ අතර එලෙසම මෙම පවුල් ඒකක සඳහා අමතර ආදායමක්ද මෙමගින් ලබා ගැනීමේ හැකියාවද ඇත. මෙම වැඩසටහන නුවරඑළිය, මහනුවර, ගාල්ල, රත්නපුර, මාතලේ සහ කෑගල්ල වැනි වතුකර දිස්ත්‍රික්ක වල ක්‍රියාත්මක විය.

2016 වසරේදී සෙවනපිටිය (පොලොන්නරුව දිස්ත්‍රික්කය), උඩවලව (රත්නපුර දිස්ත්‍රික්කය) සහ මුරුතවෙල (හම්බන්තොට දිස්ත්‍රික්කය) යන දිස්ත්‍රික්ක වල නව ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන තුනක් ඉදිකිරීම් කටයුතු නැක්ඩා විසින්ආරම්භ කරන ලදී. දකුණ සහ උතුරුමැද පළාත් වල ජලාශයන්හි මත්ස්‍ය ඇඟිල්ලන් අවශ්‍ය ප්‍රමාණයට තැන්පත් කිරීමට සැපයීම වැඩිකිරීමද එමගින් මිරිදිය සහ ජලජීවී වගා නිෂ්පාදනය වැඩිකිරීම තුලින් මෙම පළාත්වල ජනතාවගේ පෝෂණ මට්ටම වැඩිදියුණු කිරීමද මෙමගින්අපේක්ෂා කෙරේ.

මීට අමතරව විශාල වාරිමාර්ග ජලාශ උපයෝගී කර ගැනීමෙන් වගා පාදක ධීවර කර්මාන්තය, වෙරළබඩ වරල්මසුන් වගාව, මුහුදු පැළෑටි, මොදා, මට්ටි, මුහුදු කුඩැල්ලා, වේක්කයා සහ මිරිදිය ඉස්සන් වැනි වාණිජ්‍යමය ජලජීවී වගා අංශ ප්‍රජා සහ පෞද්ගලික අංශයේ සහභාගීත්වයෙන් සංවර්ධනය කිරීමද ආරම්භකර ඇත.

එබැවින් ජලජීවී වගා නිෂ්පාදන පරාසයේ වෙනසක් ඇතිකිරීම ආරම්භ කිරීමද මෙම වසරේ සිදුවිය. මඩකකුළුවා කීටයන් අභිජනනය සාර්ථකව සිදුකිරීමට හැකිවීමද මෙම වගාවේ ප්‍රධාන අවධානයට ගතයුතු වර්ධනයක් බව තව දුරටත් කිවහැක.




නව විසිතුරු මත්ස්‍ය ප්‍රභේද හඳුන්වා දීම සහ සංවර්ධනය කිරීම, නව තාක්ෂණික දැනුම වැඩිදියුණු කිරීම, මව් මසුන් සැපයීම, මත්ස්‍ය රෝග විනිශ්චය සහ පාලනය, පුහුණු වැඩසටහන් පැවැත්වීම සහ තාක්ෂණ සහාය ලබා දීම විසිතුරු මත්ස්‍ය සහ විසිතුරු ජලජ පැළෑටි වගාව සංවර්ධනය සහ අපනයනයට සහායවීම, වැනි කාර්යයන් සඳහා අප අධිකාරිය සෘජුව සම්බන්ධ වී ඇත.

විසිතුරු මත්ස්‍ය සහ ජලජ පැළෑටි ලබාදීම රම්බඩගල්ල සහ ගිනිගත්හේන විසිතුරු මත්ස්‍ය හා ජලජ පැළෑටි අභිජනන මධ්‍යස්ථානමගින්සිදුවේ. රම්බඩගල්ල මධ්‍යස්ථානයේ පටකරෝපිත විද්‍යාගාරය ස්ථාපිත කර ඇති අතර පටකරෝපිත ජලජ පැළෑටි වගා මෙහිදී සිදුවේ. විසිතුරු ජලජ පැළෑටි අපනයනය මගින් විදේශ විනිමය උපැයීම, තාක්ෂණික දැනුම හුවමාරු කර ගැනීම මෙම විද්‍යාගාරය පිහිටුවීමේ ප්‍රධාන අරමුණ වේ. අප අධිකාරියේ පටකරෝපිත විද්‍යාගාරයෙන් පමණක් විසිතුරු ජලජ පැළෑටි ලබා ගැනීම සඳහා ඇක්වා ඇග්‍රි පෞද්ගලික ආයතනය සමග නව ගිවිසුමකටද එළැඹ ඇත.

ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ ආසියා පැසිෆික් ව්‍යාපෘතිය මගින් තිල් ආර්ථිකයක් උදෙසා ප්‍රාදේශීය මට්ටමින් ජලජීවී වගාවේ තිරසාර බව වැඩිකිරීම සඳහා වැඩසටහන් හතරක් ආරම්භකර ඇත. එනම්

- නියමු ව්‍යාපෘතීන් ලෙස ජල පාදක කුඩා පරිමාණ මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකක ස්ථාපිත කිරීම.
- ජලජීවී වගාවේ අගයදාම (value chain) සංවර්ධනය සඳහා උපාය මාර්ග සංවර්ධනය
- මත්ස්‍ය ජාන විද්‍යාව සහ මව් සතුන් කළමනාකරණයට අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීම.
- ඉස්සන් වගාවේ Acute Hepatopancreatic Necrosis disease (AHPND) රෝගයේ අවදානම් තත්වය අඩුකිරීම සහ කළමනාකරණය කිරීම ආදිය වේ.

**අධ්‍යක්ෂ ජනරාල්/ප්‍රධාන විධායක නිළධාරී**
**නිමල් චන්ද්‍රරත්න (B.sc, M.sc)**

# 7. අධ්‍යක්ෂ මණ්ඩලය

නුවන් ප්‍රසන්ත මදවන් ආරච්චි මහතා (සභාපති)

සරත් ප්‍රියන්ත බණ්ඩාර මහතා

එල්. එච්. ඊ. ට්‍රිලන්ත ද සිල්වා මහතා

කලුආරච්චිගේ සරත් චමින්ද මහතා

ආර්. ඩබ්. දයාරත්න මහතා

ආචාර්ය දයා එදිරිසිංහ මහතා

හේමාල් ගුණසේකර මහතා

ජී. පී. ජනක කුමාර මහතා

ආර්. එම්. සී. එම්. හේරත් මහත්මිය

පී. එච්. හඳුන්හේවා මහත්මිය

එස්. එම්. ඩී. එල්. කේ. ද අල්විස් මහතා

ආර්. එච්. එම්. පී. අබේකෝන් මහත්මිය

එල්. ටී. ඩී. තමරා පෙරේරා මහත්මිය

# 8. ජ්‍යෙෂ්ඨ කළමනාකරණය

**පී. එන්. චන්ද්‍රරත්න මහතා** (අධ්‍යක්ෂ ජනරාල් / ප්‍රධාන විධායක නිළධාරි)

**ආචාර්ය ජේ. එම්. අශෝකා මහත්මිය** (අධ්‍යක්ෂ වෙරළබඩ ජලජීවී වගා සංවර්ධන)

**එච්. එම්. යූ. කේ. පී. බී. හේරත් මහතා** (අධ්‍යක්ෂ මිරිදිය ජලජීවී වගා සංවර්ධන)

**කේ. බී. සී. පුෂ්පලතා මහත්මිය** (අධ්‍යක්ෂ ව්‍යාප්ති)

**කේ. එන්. ඒ. දිසානායක මහතා** (අධ්‍යක්ෂ මුදල්)

**ඩබ්. එම්. අයි. කේ. විජේසේකර මහතා** (අධ්‍යක්ෂ (වැ. බ.) මානව සම්පත්)

# 9. මධ්‍යම කළමනාකරණය

එස්. ටී. විතානගේ මහතා (ජලජීවී ඉංජිනේරු)

ඩී. සුමනරත්න මහත්මිය (නීති නිළධාරි)

එම්. ඩී. නන්දසිරි මහතා (අභ්‍යන්තර විගණක)

ඩබ්. පී. ආර්. චන්ද්‍රරත්න මහතා (මත්ස්‍ය රෝග විශේෂඥ)

ආර්. එච්. පොතුවිල මහතා (සහය අධ්‍යක්ෂ පුහුණු)

එම්. ජී. ජී. ගුණසේන මහතා (සහය අධ්‍යක්ෂ - ව්‍යාප්ති)

එම්. වී. ධර්මදාස මහතා (සහකාර අධ්‍යක්ෂ - මිරිදිය)

ඒ. ආර්. මුදලිගේ මහතා (මත්ස්‍ය ජාන විශේෂඥ)

එම්. පී. විතානගේ මහතා (මත්ස්‍ය පෝෂණ විශේෂඥ)

එම්. යූ. ඩබ්. මුතුනායක මහතා (සහකාර අධ්‍යක්ෂ - මිරිදිය)

සී. කේ. සපුමොහොට්ටි මහතා (සහකාර අධ්‍යක්ෂ - ව්‍යාප්ති)

කේ. එම්. ඩී. එම්. සෝමරත්න මහතා (සහකාර අධ්‍යක්ෂ - මිරිදිය)

සමින්ද ලක්මාල් මහතා (සහකාර අධ්‍යක්ෂ - වෙරළබඩ)

ඩබ්. ඒ. ජේ. ආර්. ප්‍රනාන්දු මහතා (සහකාර අධ්‍යක්ෂ - ව්‍යාප්ති)

බී. නිරූපරාජ් මහතා (සහකාර අධ්‍යක්ෂ - වෙරළබඩ)

එස්. එච්. ඒ. සිරිකුමාර මහතා (සහකාර අධ්‍යක්ෂ - මිරිදිය)

ආර්. එම්. කීර්තිසිරි මහතා (සහකාර අධ්‍යක්ෂ - මිරිදිය)

රවිකුමාර් මහතා (සහකාර අධ්‍යක්ෂ - වෙරළබඩ)

එස්. එස්. චන්ද්‍රකීර්ති මහතා (සහකාර අධ්‍යක්ෂ - ව්‍යාප්ති)

සී. එස්. අයි. පතිරණ මහතා මහතා (සහකාර අධ්‍යක්ෂ - මිරිදිය)

ආර්. එම්. එන්. පී. කේ. රණතුංග මහතා (සහකාර අධ්‍යක්ෂ - වෙරළබඩ)

ඩබ්. සී. ජයවීර මහතා (සහකාර අධ්‍යක්ෂ - වෙරළබඩ)

ඒ. එම්. ඩී. එන්. එස්. අතපත්තු මහතා (සහකාර අධ්‍යක්ෂ - වෙරළබඩ)

ඒ. එම්. එෆ්. යස්මිනා මහත්මිය (සහකාර අධ්‍යක්ෂ - මුදල්)

# 10. අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂවරුන්, 2016 වර්ෂය සඳහා විගණන මූල්‍ය වාර්තාව සමඟ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරනු ලබන්නේ ඉතා සතුටිනි.

## ව්‍යාපාර සමාලෝචනය

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ 2016 දෙසැම්බර් 31 දිනට අවසන් මුදල් වර්ෂය සඳහා විස්තර වාර්තාවක් සභාපතිවරයාගේ පණිවිඩයෙන්, සහ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කරන ලද කාර්යයන් පිළිබඳ ලබා දී ඇති සමාලෝචනයෙන් පැහැදිලි වේ. මෙයට අමතරව කරන ලද කාර්යයන් පිළිබඳ සම්පූර්ණ සමාලෝචනයක් රජයේ විගණන අංශය මගින් විගණන වාර්තාවෙන් ද පැහැදිලි කරයි.

## ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ නීතිමය තත්වය

1998 අංක 53 දරණ ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරි පනතේ විධිවිධාන යටතේ 1996 වර්ෂයේ ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ (නැක්ඩා) ස්ථාපනය කරන ලදි. ශ්‍රී ලංකාවේ ජලජීවී වගාව සහ මිරිදිය ධීවර කර්මාන්තය යන අංශයන් දියුණු කිරීම සඳහා පිහිටුවන ලද එකම රාජ්‍ය ආයතනය මෙම අධිකාරිය වේ. වර්තමානයේ මෙම ආයතනය ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

## අධ්‍යක්ෂ මණ්ඩලය

2016 වර්ෂය තුලදී ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ (නැක්ඩා) අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජිකයින් 16 දෙනෙකුගෙන් සමන්විත විය.

## අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සඳහා සහභාගීවීම 2016

| සාමාජිකයාගේ නම | තනතුර හා ආයතනය | පත්කල දිනය |
|---|---|---|
| 1. නීතීඥ උපාලි මොහොට්ටි මහතා | සභාපති (නැක්ඩා) | 2015/10/30 |
| 2. කේ. ජී. ඒ. ගුණරත්න මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 2015/10/30 |
| 3. ඩබ්. අයි. දීපාල් පීරිස් මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 2015/10/30 |
| 4. විදුර හදජිත් රත්නායක වීරකෝන් (නීතීඥ හා ප්‍රසිද්ධ නොතාරිස්) මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 2015/10/30 |
| 5. නෙල්සන් වන්නිආරච්චි අබේගුණවර්ධන මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 2015/10/30 |
| 6. පී. එච්. හඳුන්හේවා මහත්මිය | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (අපනයන කෘෂිකර්ම හා සේවා) කෘෂිකර්ම අමාත්‍යාංශය | 2015/07/20 |
| 7. තුසිත අලුත්පටබැඳිගේ මහතා | සභාපති ලංකා ධීවර සංස්ථාව | 2016/08/26 |
| 8. ජගත් කුමාර පෙරේරා මහතා | | 2016/09/06 |
| 9. ආචාර්ය අනිල් පෙරේරා මහතා | සභාපති ජාතික ජලජසම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිත ආයතනය | 2015/10/30 |
| 10. එම්. සී. එල්. ප්‍රනාන්දු මහතා | අධ්‍යක්ෂ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | 2015/05/08 |
| 11. ආර්. එම්. සී. එම්. හේරත් මහත්මිය | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් මහවැලි සංවර්ධන අධිකාරිය | 2016/04/19 |
| 12. ඉංජි. එස්. එම්. ඩී. එල්. කේ. ද අල්විස් මහතා | අධ්‍යක්ෂ ජල සම්පත් කළමණාකරන වාරිමාර්ග සහ ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශය | 2016/04/27 |
| 13. ආර්. එච්. එම්. පී. අබේකෝන් මහත්මිය | අධ්‍යක්ෂ (ජෛව විවිධත්ව) මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | 2016/07/22 |
| 14. හිරන්සා කලුතන්ත්‍රී මහත්මිය | අධ්‍යක්ෂ කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව | 2015/03/20 2016/11/25 |

## අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සඳහා සහභාගීවීම 2016

| No. | අධයක්ෂවරයාගේ නම | පත්කල දිනය | රැස්වීම් සංඛ්‍යාව | සහභාගී වූ රැස්වීම් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | නීතිඥ උපාලි මොහොට්ටි මහතා | 2015/10/30 | 12 | 12 |
| 2 | කේ. ජී. ඒ. ගුණරත්න මහතා | 2015/10/30 | 12 | 09 |
| 3 | ඩබ්. අයි. දීපාල් පීරිස් මහතා | 2015/10/30 | 12 | 09 |
| 4 | විදුර හඳජිත් රත්නායක වීරකෝන් මහතා (නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස්) | 2015/10/30 | 12 | 11 |
| 5 | නෙල්සන් වන්නිආරච්චි අබේගුණවර්ධන මහතා | 2015/10/30 | 12 | 12 |
| 6 | පී. එච්. හඳුන්හේවා මහත්මිය | 2015/07/20 | 12 | 11 |
| 7 | තුසිත අලුත්පටබැඳිගේ මහතා | 2016/08/26 | 12 | 07 |
| 8 | ජගත් කුමාර පෙරේරා මහතා | 2016/09/06 | 12 | 02 |
| 9 | ආචාර්ය අනිල් පෙරේරා මහතා | 2015/10/30 | 12 | 09 |
| 10 | එම්. සී. එල්. ප්‍රනාන්දු මහතා | 2015/05/08 | 12 | 06 |
| 11 | ආර්. එම්. සී. එම්. හේරත් මහත්මිය | 2016/04/19 | 12 | 06 |
| 12 | ඉංජි. එස්. එම්. ඩී. එල්. කේ. ද අල්විස් මහතා | 2016/04/27 | 12 | 04 |
| 13 | හිරන්සා කලුතන්ත්‍රී මහත්මිය | 2015/03/20 2016/11/25 | 12 | 07 |
| 14 | ආර්. එච්. එම්. පී. අබේකෝන් මහත්මිය | 2016/07/22 | 12 | 04 |

## විගණන කමිටුව

- කේ. ජී. ඒ. ගුණරත්න මයා
- කේ. පී. ඒ. ගුණරත්න මහතා
- නෙල්සන් වන්නිආරච්චි අබේගුණවර්ධන මහතා
- හිරන්සා කලුතන්ත්‍රී මහත්මිය
- පී. එච්. හඳුන්හේවා මහත්මිය
- ජී. එස්. එස්. ජී. පෙරේරා මහත්මිය

විගණන කමිටුවේ වාර්තාව මේ සමඟ ලබා දී ඇත.

## දැක්ම හා මෙහෙවර

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ දැක්ම හා මෙහෙවර පිටු අංක 5 හා 6 හි දක්වා ඇත.

## විගණකවරු

විගණකාධිපති විසින් වසරට අදාල මූල්‍ය වාර්තාව විගණනය කර ඇත. විගණකවරු පත්කිරීම සනාථ කිරීම සඳහා සකස් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී යෝජනා වී ඇත.

**අධිකාරියේ කාර්යය මණ්ඩලය**

| **වර්ගීකරණයන්** | **ප්‍රමාණය** |
|---|---|
| ජ්‍යෙෂ්ඨ කළමණාකරුවන් | 05 |
| මධ්‍යම කළමණාකරුවන් | 11 |
| කණිෂ්ඨ කළමණාකරුවන් | |
| ජලජීවී විද්‍යාඥයන් | 42 |
| ප්‍රාදේශීය/ දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති නිළධාරීන් | 18 |
| සංඛ්‍යාලේඛණ නිළධාරීන් | 03 |
| පරිගණක විශ්ලේෂක | 01 |
| ප්‍රසම්පාදන නිළධාරී | 01 |
| සමාජ සංවර්ධන නිළධාරී | 01 |
| මූල්‍ය නිළධාරී | 01 |
| පරිපාලන නිළධාරීන් | 01 |
| කළමණාකරණ සහකාර තාක්ෂණ | |
| සහකාර ජලජීවී විද්‍යාඥ | 15 |
| ජලජීවී වගා ව්‍යාප්ති නිළධාරීන් | 97 |
| තාක්ෂණ නිළධාරීන් | 03 |
| පොත් තබන්නා | 01 |
| වැඩමූලික | 01 |
| කලමණාකාරණ සහකාර - තාක්ෂණ නොවන | 70 |
| ප්‍රාථමික තලය | |
| රියදුරන් | 42 |
| සුළු සේවකයින | 292 |
| මුළු ගණන | **605** |

## අඛණ්ඩභාවය

අධිකාරියේ කටයුතු අඛණ්ඩව කරගෙනයාමේ අනාගත දැක්ම සඳහා අධිකාරිය සතුව ප්‍රමාණවත් සම්පත් ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩල විසින් සෑහීමට පත් වේ. ඒ හේතුවෙන් මූල්‍ය වාර්තාව සකසා ඇත්තේ අඛණ්භාවය පදනම් කරගෙනය.

## මූල්‍ය වාර්තාව

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ මූල්‍ය වාර්තාව ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිතීන්, 1998 අංක 53 දරණ ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරි පනත හා එහි සංශෝධනයන් සහ එක පොදුවේ පිළිගත් මූල්‍ය සිද්ධාන්තයන් සහ නිතර අදාල වන මූල්‍ය සිද්ධාන්තයට අනුකූලව අඛණ්ඩභාවය පදනම් කරගෙන සකස්කර ඇත.

මූල්‍ය ප්‍රකාශනයන් සකස් කිරීමේදී අවශ්‍ය සාධාරණ හා දූරදර්ශී තීන්දු ද සිදුකර ඇත.

## ආදායම්

2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියෙහි ආදායම රු.105,254,468.35 ක් වේ.

## ප්‍රාග්ධන වියදම්

මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ පෙන්වා දී ඇති පරිදි වර්ෂය තුල දේපල පිරියත හා උපකරණ මිලදී ගැනීම සඳහා වන ප්‍රාග්ධන වියදම වූයේ රු. 47,723,068.98 කි.

## ව්‍යවස්ථාපිත ගෙවීම

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය දැනුමේ හා විශ්වාසයේ පරිදි රජයට හා අධිකාරියේ සේවකයින්ට අධිකාරිය මඟින් ගෙවිය යුතු ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත කාලය තුල ගෙවීම සම්බන්ධයෙන් සෑහීමට පත් වේ.

## පසුගිය ශේෂපත්‍ර අවස්ථාව

ශේෂපත්‍ර දිනයෙන් පසු, කිසිදු ගැලපීමක් හෝ හෙළිදරව්වීමක් සිදු නොමැත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි

.......................................................

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්,
ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

**(නීති නිළධාරිනී)**
**ඩී. සුමනරත්න මහත්මිය**
**නීතිඥ (එල්. එල්. බී.)**
**ප්‍රසිද්ධ නොතාරිස් සහ දිවුරුම් කොමසාරිස්**

# 11. අධ්‍යක්ෂවරුන්ගේ ඇගයීම්

## 11.2 වෙරළබඩ ජලජීවී වගා සංවර්ධන අධ්‍යක්ෂකගේ ඇගයීම

ශ්‍රී ලංකාව තුල විසිතුරු මත්ස්‍ය සහ වෙරළබඩ ජලජීවී වගාව ප්‍රවර්ධන කාර්ය සම්බන්ධව ක්‍රියාකරනුයේ ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ වෙරළබඩ අංශය මගිනි. මෙම අංශය යටතේ වෙරළබඩ ජලජීවී වගා ව්‍යාප්ති හා අධීක්ෂණ ඒකක දෙකක් ද, මිරිදිය ඉස්සන් අභිජනන මධ්‍යබස්ථාන දෙකක් සහ විසිතුරු මත්ස්‍ය අභිජනන සහ පුහුණු මධ්‍යධස්ථානයක් ද ස්ථාපිත කර ඇත.

**ඉස්සන් වගාව**

ශ්‍රී ලංකාවේ වඩාත් ලාභදායි වාණිජ්‍යමය ජලජීවී වගාවක් ලෙස ඉස්සන් වගාව හැඳින්විය හැක. 2016 වසරේ ඉස්සන් නිෂ්පාදනය සහ අපනයනය පිලිබඳ තොරතුරු රූප සටහන් 01 මගින් දැක්වේ. මෙම අංශය යටතේ පුත්තලම සහ මඩකලපුව දිස්ත්‍රික්කවල වෙරළබඩ ජලජීවී වගා ව්‍යාප්ති හා අධීක්ෂණ ඒකක පිහිටුවා ඇත. නැක්ඩා ආයතනය මැදිහත්වීමෙන් ක්‍රියාත්මක කර ඇති හෝ දැනට ක්‍රියාත්මක කරන වැඩසටහන් මගින් රෝගී තත්වය අවම කිරීමට සහ පාලනය කිරීමට හැකි වී ඇත.








රූප සටහන 01
ඉස්සන් නිෂ්පාදනය සහ අපනයනය 2016

නැක්ඩා ආයතනයේ පසුගිය වසර කීපය තුල වෙරළබඩ ජලජීවී වගා ව්‍යාප්ති හා අධීක්ෂණ ඒකක මගින් ඉස්සන් වගා කර්මාන්තයේ පුනරුත්ථාපනය සඳහා විවිධ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කර ඇති අතර, ඒ හේතුවෙන් සුදු පුල්ලි රෝගයෙන් සිදුවන බලපෑම අඩුවිය. ලන්දේසි ඇල හැරීම, වගා කන්න කාල සටහන් හඳුන්වාදීම, කලාපකරණය, නීති රෙගුලාසි සකස් කිරීම සහ යහපත් ජලජීවී වගා ක්‍රියාකාරකම් හඳුන්වා දීම වැනි ප්‍රධාන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක විය. බත්තුළුඔය බහු අවයවිකදාම ප්‍රතික්‍රියා විද්‍යාගාරය තුලදී ඉස්සන්ට වැළදෙන රෝග පරීක්ෂා කිරීමෙන් ඉස්සන් වගාකරුවන්ට සේවයක් ද සපයනු ලැබේ. 2016 වසරේදී සුදු පුල්ලි රෝගය සඳහා (PCR) පරීක්ෂණ 5804 සිදුකර ඇති අතර පුත්තලම දිස්ත්‍රික්කයේ හෙක්ටයාර 1300 ක වපසරියක මෙම වගාව ක්‍රියාත්මක වූ අතර පෞද්ගලික අභිජනනාගාර තුල පසුකීටයන් මිලියන 533 නිෂ්පාදනය කරන ලදී. මඩකලපුව දිස්ත්‍රික්කයේ හෙක්ටයාර 106 ක වපසරියක මෙම වගාව ක්‍රියාත්මක වේ. රාජ්‍ය හා පෞද්ගලික ව්‍යවසාය යටතේ පෞද්ගලික සමාගමක් මගින් ක්‍රියාත්මක කරන ඉස්සන් අභිජනනාගාරයේ, 2016 වසරේ මිලියන 21.4 ක් නිෂ්පාදනය කල අතර මඩකලපුව දිස්ත්‍රික්කයේ වගා පොකුණු තුල මිලියන 18.4 ක් තැන්පත් කිරීම සිදුවිය.



වෙරළබඩ ජලජීවි වගා ව්‍යාප්ති හා අධීක්ෂණ ඒකකය බත්තුළුඔය ,පුත්තලම දිස්ත්‍රික්කය



බහු අවයවිකදාම ප්‍රතික්‍රියා විද්‍යාගාරය බත්තුළු

## මිරිදිය ඉස්සන් වගාව

වාර්ෂික නිෂ්පාදන ධාරිතාව මිලියන 20 වු නව අභිජනන මධ්‍යස්ථානයක් ඉදිකර කහඳමෝදර මිරිදිය ඉස්සන් අභිජනන මධ්‍යස්ථානය පුළුල් කිරීම 2016 වසරේ සිදුවිය. එසේම මිරිදිය ඉස්සන් පසුකීටයන් මිලියන 10 ක අතිරේක නිෂ්පාදනයක් ලබාගැනීමට පම්බල මිරිදිය ඉස්සන් අභිජනන මධ්‍යස්ථානය පුළුල් කිරීම ද සිදුවිය.

අප අධිකාරියේ මිරිදිය ඉස්සන් අභිජනන මධ්‍යස්ථාන සහ පෞද්ගලික අභිජනනාගාරයේ නිෂ්පාදන තුලින් මිලියන 39.64 පසුකීටයන් ප්‍රමාණයක් ජලාශ සහ පොකුණු තුල 2016 තැන්පත් කරන ලදී.

මිරිදිය ඉස්සන් නිෂ්පාදනය මෙට්රිතක් ටොන් 705ක් වු අතර මෙට්‍රික් ටොන් 101ක් අපනයනය කිරීම මඟින් රු. මිලියන 224 ක විදේශීය විනිමය ලබාගැනීම ද මෙම වසරේ සිදුවිය. මෙමඟින් රු.මිලියන 846 දායකත්වයක් ද ග්‍රාමීය ආර්ථිකයට ලැබී ඇත.





මිරිදිය ඉස්සන් අභිජනන මධ්‍යස්ථානය කහඳමෝදර



මිරිදිය ඉස්සන් අභිජනන මධ්‍යස්ථානය පම්බල

## විසිතුරු මත්ස්‍ය වගාව






විසිතුරු මත්ස්‍ය කර්මාන්තය ශ්‍රී ලංකාව තුල පුළුල් පැතිරීමක් සිදුවී ඇති අතර 2016 වසරේ විසිතුරු මත්ස්‍ය හා ජලජ පැළෑටි අපනයන වටිනාකම රු. මිලියන 1847 කි. නව විසිතුරු මත්ස්‍ය ප්‍රභේද හඳුන්වා දීම සහ සංවර්ධනය කිරීම, නව තාක්ෂණික දැනුම වැඩි දියුණු කිරීම, මව් සතුන් සැපයීම, මත්ස්‍ය රෝග විනිශ්චය සහ පාලනය, පුහුණු වැඩසටහන් පැවැත්වීම සහ තාක්ෂණ සහය ලබාදීම, විසිතුරු මත්ස්‍ය සහ විසිතුරු ජලජ පැළෑටි වගාව සංවර්ධනය සහ අපනයනයට සහය වීම වැනි කාර්යයන් සඳහා අප අධිකාරිය සෘජුව සම්බන්ධ වී ඇත. විසිතුරු මත්ස්‍ය සහ ජලජ පැළෑටි ලබාදීම රම්බඩගල්ල සහ ගිනිගත්හේන විසිතුරු මත්ස්‍ය හා ජලජ පැළෑටි අභිජනන මධ්‍යස්ථාන මඟින් සිදු වේ. මව් සතුන් 92, 713 ඇතුළුව විසිතුරු මසුන් මිලියන 1.75 මෙම අභිජනන මධ්‍යස්ථාන මඟින් 2016 වසරේ අලෙවි විය. රම්බඩගල්ල මධ්‍යස්ථානයේ, පටක රෝපිත විද්‍යාගාරය ස්ථාපිත කර ඇති අතර පටක රෝපිත විසිතුරු ජලජ පැළෑටි වගාව මෙහිදි සිදුවේ.

තාක්ෂණික දැනුම ව්‍යවසායකයින්, උපාධි අපේක්ෂකයන් අතර හුවමාරු කර ගැනීම, නිෂ්පාදනය කරන විසිතුරු පැළෑටි වල ප්‍රභේද වර්ග වැඩිකර අපනයනය තුලින් විදේශ විනිමය ඉපැයීම මෙම විද්‍යාගාරය පිහිටුවීමේ ප්‍රධාන අරමුණ වේ. 2016 වසරේ පටක රෝපිත ජලජ පැළෑටි 44220 ක් නිෂ්පාදනය කල අතර පැළ 40880 ක ප්‍රමාණයක් අපනයනය කරන ලදී. විසිතුරු මත්ස්‍ය අභිජනන හා පුහුණු මධ්‍යස්ථානයේ දී වැඩසටහන් 22 ක් පවත්වා පුහුණුලාභීන් 696 දෙනෙකුට පුහුණුව ලබා දී ඇත.

“මින් විසිතුරු” 2016 විසිතුරු මත්ස්‍ය, ජලජ පැළෑටි සහ උපාංග ප්‍රදර්ශනය විසිතුරු මත්ස්‍ය වගාව පිලිබඳ උනන්දුවන්නන්ගේ සහ නිෂ්පාදකයන්ගේ දැනුම වැඩි දියුණු කිරීම, නව විසිතුරු මත්ස්‍ය ප්‍රභේද හඳුන්වාදීම, ශ්‍රී ලංකාව තුල විසිතුරු මත්ස්‍ය හා ජලජ පැළෑටි නිෂ්පාදනය සඳහා අපනයන වෙළඳපල පුළුල් කිරීමේ අරමුණින් පවත්වන මෙම ප්‍රදර්ශනය ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපති අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විසින් උත්සවාකාරයෙන් ආරම්භ කල අතර, ඒ සඳහා 35 987ක පිරිසක් සහභාගි වූහ.





“මින් විසිතුරු”2016 විසිතුරු මත්ස්‍ය , ජලජ පැළෑටි සහ උපාංග ප්‍රදර්ශනය

## අනෙකුත් වෙරළබඩ ජලජීවී වගා ව්‍යාපෘති

නැක්ඩා ආයතනයේ වෙරළබඩ ජලජීවී වගා අංශය මගින් මොදා වගාව, කකුළුවන් වගාව, මුහුදු පැළෑටි වගාව, මුහුදු කුඩැල්ලන් වගාව, පොකිරිස්සන් වගාව ආදි අනෙකුත් වෙරළබඩ ජලජීවී වගා ව්‍යාපෘති අධීක්ෂණය කිරීම සිදුවේ. මෙම වගාවන් මගින් 2016 වසරේ ලබාගත් නිෂ්පාදන පිළිබඳ තොරතුරු රූප සටහන් 02 මගින් දැක්වේ.




රූපසටහන් 02
අනෙකුත් වෙරළබඩ ජලජීවී වගා නිෂ්පාදනය (මෙ. ටො.) 2016



මුහුදු පැළෑටි වගාව



කකුළුවන් වගාව



මුහුදු කුඩැල්ලන් වගාව



මොදා වගාව

## 2017 වසර සඳහා යෝජිත නව ව්‍යාපෘති

1. මඩකලපුව දිස්ත්‍රික්කයේ බහු ප්‍රභේද මුහුදු වරල් මසුන් අභිජනනාගාරයක් ඉදිකිරීම.
2. මන්නාරම දිස්ත්‍රික්කයේ ජලජීවී වගා ආයෝජන ප්‍රවර්ධන කලාපයක් පිහිටුවීම.
3. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ මිරිදිය ඉස්සන් ගෘහස්ථ අභිජනනාගාරයක් ඉදිකිරීම.
4. මන්නාරම දිස්ත්‍රික්කයේ මුහුදු කුඩැල්ලන් අභිජනනාගාරක් ඉදිකිරීම.
5. කකුළුවන් අලෙවි මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම.
6. පොලොන්නරුව දිස්ත්‍රික්කයේ විසිතුරු මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානයක් පිහිටුවීම.

**අධ්‍යක්ෂ (වෙරළබඩ ජලජීවී වගා සංවර්ධන)**
**ආචාර්ය ජේ. එම්. අශෝකා මහත්මිය**

# 11.2 මිරිදිය ජලජීවී වගා සංවර්ධන අධ්‍යක්ෂකගේ ඇගයීම

ජලජ සතුන් හා ජලජ පැලෑටි වගාව ජලජීවී වගාව ලෙස හඳුන්වනු ලබයි. ජලජ ජීවීන් බෝ කිරිම, සමාජ සුබ සිද්ධිය සඳහා නිෂ්පාදනය ඉහළ නැංවීම මූලික අරමුණ ඇතිව මිනිසාගේ පූර්ණපාලනය යටතේ ජලජ ජීවීන්ගේ ජීවන චක්‍රයේ එක් අවස්ථාවක් හෝ හසුරුවාලීම ජලජීවී වගාවේ දී සිදු කරනු ලබයි.

ජලජීවී වගාව මිරිදිය, කිවුල්දිය හා මුහුදු ජලයේ සිදුකළ හැක. ශ්‍රී ලංකාවේ සිදුකෙරෙන ජලජීවී වගාවෙන් 90% පමණ ප්‍රමාණයකට දායකත්වය දක්වන්නේ මිරිදිය ජලජීවී වගාවයි. එහිදී මූලික වශයෙන් කාප් විශේෂ හා තිලාපියා විශේෂ මූලික වේ.

වර්ෂ 2016 දී සම්පූර්ණ මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 73,930 වන අතර එයින් මෙට්‍රික්ටොන් 54780 ක් කාප් විශේෂ හා තිලාපියා විශේෂ වේ. මෙම නිෂ්පාදනය ලබාගැනීම සඳහා ශ්‍රී ලංකාවේ විශාල, මධ්‍යම හා කුඩා ජලාශ එමෙන්ම කාලීන ජලාශ හා වතු ජලාශ සඳහා වාර්ෂික ජාතික සැලැස්මක් යටතේ මත්ස්‍ය බීජ තැන්පත් කෙරෙන අතර වෙනත් ජලජීවී ක්‍රම සඳහා ද (උදාඃ පොකුණු, කූඩු හා කොරටු) වගාකරුවන් වෙත මත්ස්‍ය බීජ සැපයේ.

මෙසේ ජලාශවල තැන්පත් කෙරෙන සහ වගාකරුවන් වෙත සැපයෙන මත්ස්‍ය ඇඟිල්ලන් නිෂ්පාදනයේ ප්‍රමුඛයා වන්නේ ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ මිරිදිය ජලජීවී වගා අංශය මඟින් පාලනය වන ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන වේ. ඒ අනුව ජලජීවී වගා සංවර්ධන අංශය යටතේ දඹුල්ල, ඉඟිණියාගල, උඩවලව (කාප්), උඩවලව (තිලාපියා), කලාවැව, ඉරණමඩු, නුවරඑළිය හා මුරුතවෙල යන ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන ක්‍රියාත්මක වේ. වර්ෂ 2016 දී නිෂ්පාදනය කරන ලද මත්ස්‍ය ඇඟිල්ලන් (කාප් විශේෂ හා තිලාපියා විශේෂ) සංඛ්‍යාවෙන් 54% මෙම මධ්‍යස්ථානවලින් ඍජුවම නිෂ්පාදනය කල අතර, ප්‍රජා මූලික කුඩා පරිමාණ මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකක සහ පෞද්ගලික මත්ස්‍ය බීජ නිෂ්පාදන පොකුණු හිමියන් හා කූඩු ව්‍යාපෘති හා කොරටු ව්‍යාපෘති වලින් නිපදවන ලද්දේ සමස්ථ ඇඟිල්ලන් නිෂ්පාදනයෙන් 46% කි. කෙසේ වෙතත් එම සියළුම පසුකීටයන් සහ ඇසිත්තන් නිෂ්පාදනය කරනු ලැබූයේ අප අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන මගිනි.

වර්ෂ 2016 දී ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානවලින් පසුකීටයන් මිලියන 137.3 ක් ඇසිත්තන් මිලියන 112.3 ක් සහ ඇඟිල්ලන් මිලියන 37.3 නිපදවා ඇත. වර්ෂ 2016 දී ජලජීවී වගා සංවර්ධන අධිකාරිය මඟින් නිෂ්පාදනය කරනු ලබන මත්ස්‍ය ඇසිත්තන් සංඛ්‍යාව ඉහල නැංවූ අතර එම ප්‍රමාණය 2015 වර්ෂය හා සැසඳීමේ දී 30% සීඝ්‍ර වැඩිවීමකි. එහිදී මිරිදිය අංශයේ ඉලක්කය වූයේ එම ඇසිත්තන් ප්‍රමාණය බාහිර වගාකරුවන් වෙත ලබාදී සමස්ත ඇඟිල්ලන් නිෂ්පාදනය ඉහල නැංවීමයි. ඒ අනුව 2015 වර්ෂයේ දී සමස්ත නිෂ්පාදනය වූ මිලියන 55.2 2016 වර්ෂයේ දී මිලියන 69.8 දක්වා වර්ධනය වූ අතර එය මිලියන 14.6 වැඩිවීමකි.

ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානවල නිෂ්පාදනය පහත දක්වා ඇත.



ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානවලින් නිෂ්පාදනය කරනු ලැබූ මත්ස්‍ය විශේෂ අනුව ප්‍රතිශතය පහත සටහනින් දැක්වේ.




මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය වැඩිකිරීම තුලින් පෝෂණ මට්ටම සහ ග්‍රාමීය ආර්ථිකය ඉහළ නැංවීම සඳහා දකුණු සහ උතුරු මැද පළාතේ ජලාශ වලට මත්ස්‍ය ඇඟිල්ලන් ලබා දීමේ අරමුණින් අධිකාරිය විසින් ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන තුනක් පොළොන්නරුව සෙවනපිටිය හම්බන්තොට මුරුතවෙල සහ රත්නපුර උඩවලව යන ස්ථානයන්හි ඉදිකරීම් ආර්ම්භ කර ඇත සෙවනපිටිය මධ්‍යස්ථානය සඳහා ඇස්තමේන්තුගත වියදම රු. මි. 400 වන අතර මෙම ප්‍රතිපාදන ''පිබිදෙමු පොළොන්නරුව'' වැඩසටහන යටතේ ද උඩවලව මධ්‍යස්ථානය සඳහා ඇස්තමේන්තුගත වියදම රු. මි. 250 වන අතර මෙම ප්‍රතිපාදන ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන යටතේ ද මුරුතවෙල මධ්‍යස්ථානය සඳහා ඇස්තමේන්තුගත වියදම රු. මි. 400 වන අතර මෙම නිෂ්පාදන භාණ්ඩාගාරය මගින් ලබා දී ඇත.



මුරුතවෙල ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන



පොළොන්නරුව ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන

අධ්‍යක්ෂ (මිරිදිය ජලජීවී වගා සංවර්ධන)
එච්. එම්. යූ. කේ. පී. බී. හේරත් මහතා (B.sc, M.sc)

# 11.3 ජලජීවී වගා ව්‍යාප්ති අංශයේ අධ්‍යක්ෂතුමියගේ ඇගයීම

වගා පාදක ධීවර කර්මාන්තය යහපත් ලෙස කළමණාකරනය තුලින් මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය ඉහල නැංවීමට ජලජීවී වගා ව්‍යාප්ති අංශයේ ප්‍රධාන වගකීම වේ. මේ සඳහා දිස්ත්‍රික් ජලජීවී නිලධාරින් 22 ක් හා ජලජීවී වගා ව්‍යාප්ති නිලධාරින් 110 ක් දිවයිනම ආවරණය වන සේ ජලජීවී ව්‍යාප්ති කටයුතුවල නියැලී සිටියි.




රූපය 01. මිරිදිය මත්ස්‍ය සහ ජලජීවී නිෂ්පාදනය(2012 සිට 2016 දක්වා)



රූපය 01. ජලාශයකින් ලබාගත් මත්ස්‍ය අස්වැන්න

මිරිදිය ජලාශවල මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය ඉහල නැංවීමට යොදාගත හැකි ප්‍රධාන උපාය මාර්ගයකි තැන්පත කරන මත්ස්‍ය ඇඟිල්ලන් සංඛ්‍යාව ඉහල නැංවීම. ජලාශවලට අවශ්‍ය මත්ස්‍ය ඇඟිල්ලන් ප්‍රමාණය ජලාශ තුලම කුඩු හා කොරටු යොදාගෙන නිෂ්පාදනය කර ගැනීම සඳහා ධීවර ප්‍රජාව ක්‍රියාකාරිව සහභාගි කර ගැනීමට කටයුතු කර ඇත. මීට අමතරව ප්‍රජා සහභාගීත්ව මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකක 22 ක් දිවයින පුරා ක්‍රියාත්මක වේ.

මේවායේ මත්ස්‍ය ඇඟිල්ලන් නිෂ්පාදනය කිරිම මත්ස්‍ය ප්‍රධාන ඉලක්කයයි. මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකක වලින් 2016 වර්ෂය තුල මත්ස්‍ය ඇඟිල්ලන් මිලියන 10.08ක් නිෂ්පාදනය කර ගැනීමට හැකි විය. මීට අමතරව කුඩු හා කොරටු (cage & pen) භාවිතයෙන් 2016 වර්ෂය තුල මත්ස්‍ය ඇඟිල්ලන් මිලියන 21 ක් නිෂ්පාදනය කල අතර මෙය 2016 වර්ෂය තුල නිෂ්පාදනය කල මුළු මත්ස්‍ය ඇඟිල්ලන් සංඛ්‍යාව 31.7 ක් පමණ වේ.

මිරිදිය ධීවර ප්‍රජාවගේ සමාජ සංවර්ධනය සඳහා "වැවක් සමඟ ගමක් " වැඩසටහන 2018 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරන අතර මේ යටතේ තොටුපල මාර්ග, ජල හා විදුලි පහසුකම්, පූර්ව ළමාවිය පාසල්, ප්‍රජා ශාලා ලබා දීම සිදුකරයි. 2016 වර්ෂයේ දී මේ සඳහා රුපියල් මිලියන 25ක් වැය කලේය.




රූප සටහන 02 : 2016 වර්ෂය තුල මත්ස්‍ය ඇඟිල්ලන් නිෂ්පාදන ඒකක



රූපය 02 : මහනුවර වික්ටෝරියා ජලාශයේ ඇස්ත්තන් කූඩු



රූපය 03 : ප්‍රජා මූලික මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකකයක්

ධීවර ප්‍රජාව සවිබල ගැන්වීම හා ධීවර සංවිධානවල චක්‍රීය අරමුදල වර්ධනය කිරිමට අල්ලනු ලබන සෑම මත්ස්‍ය කිලෝග්‍රෑම් 1 කින් රුපියල් 20 ක් සමතියට බැරවන ලෙස වැඩපිලිවෙලක් ආරම්භ කර ඇති අතර දැනට රුපියල් මිලියන 120 දක්වා වර්ධනය වී ඇත. මීට අමතරව අනවසර ධීවර කටයුතු පාලනය කරමින් මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කිරිමට ධීවර ඔරු 500 ක් ධීවර ප්‍රජාව අතරේ බෙදාදෙන ලදි.

තාක්ෂණය ලබා දීම කුසලතා හා නිපුනතා වර්ධනය සඳහා පුහුණුවීම් පවත්වන අතර මේ සඳහා අනුරාධපුරය කලාවැව පිහිටුවා ඇති මිරිදිය ධීවර හා ජලජීවී වගා පුහුණු මධ්‍යස්ථානය උතුරු මැද පලාතේ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන අතර ඉතා ප්‍රචලිතව ඇති බවද තවදුරටත් සඳහන් කරමි.



රූපය 04 : ධීවරයින් සඳහා ඔරු බෙදා දීම

**අධ්‍යක්ෂ (ව්‍යාප්ති)**
**කේ. බී. සී. පුෂ්පලතා මහත්මිය** (B.sc, MA, M.Phil)

# 11.4 ජලජීවී ඉංජිනේරු මහතාගේ ඇගයීම

ජලජීවී ඉංජිනේරු අංශය ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ ප්‍රගමනයට අවශ්‍යය වන පොකුණු, අභිජනනාගාර සහ අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධනය හා සැපයීම සඳහා අවශ්‍යය වන ව්‍යුහාත්මක සහ ඉංජිනේරු සැලසුම් ඉදිරිපත් කිරිම, අධීක්ෂණය, නඩත්තු කිරීම සහ ක්‍රියාකාරීව පවත්වා ගෙනයාමට අවශ්‍යය පහසුකම් සැපයිමෙහිලා දායකත්වය ලබා දෙයි.

ජලජීවී වගා සංවර්ධනයට පසුබිම් වන ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ වෙරළබඩ ජලජීවී වගා සංවර්ධන අංශය, මිරිදිය ධීවර අංශය හා ව්‍යාප්ති අංශයන්ට අදාල වන ඉදිකිරීම් කටයුතු සිදුකිරිමට අවශ්‍යය ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඇති කිරීමෙහි ලා මූලික සංකල්පනාත්මක අවධියේ සිට ක්‍රියාකාරිව පවත්වාගෙන යන අවධිය දක්වා කටයුතු සිදුකරනු ලබන අතර ජලජීවී වගාවට සම්බන්ධ කර්මාන්ත ආරම්භ කිරිමට අපෙක්ෂා කරන පර්ශවකරුවන්ට හා ව්‍යවසායකයන්ට තාක්ෂණික දැනුම ලබා දීමටද කටයුතු කරයි.

**2017 හා 2018 වර්ෂවල ක්‍රියාත්මක කිරිමට යෝජිත ව්‍යාපෘති**

1. "පිබිදෙමු පොලොන්නරුව" වැඩසටහන යටතේ සෙවනපිටිය වැලිකන්ද ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානය ඉදිකිරිම.
2. හම්බන්තොට මුරුතවෙල ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානය ප්‍රතිසංස්කරණය කිරිම
3. ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන යටතේ දඹුල්ල, උඩවලව කාප්, උඩවලව තිලාපියා, මධ්‍යස්ථානය ඉගිණියාගල යන ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානවල හා කලාවැව මිරිදිය ධිවර හා ජලජීවී පුහුණු ආයතනයේ පොකුණු පුළුල් කිරිම හා යටිතල පහසුකම් සංවර්ධනය.
4. ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන යටතේ උඩවලව නව ජලජීවි වගා සංවර්ධන මධ්‍යස්ථානය ඉදිකිරිම.
5. ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන යටතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කල්ලරාව මිරිදිය ඉස්සන් අභිජනන මධ්‍යස්ථානය ඉදිකිරිම.
6. මන්නාරම දිස්ත්‍රික්කයේ ඔලේතුඩුව ප්‍රදේශයේ මුහුදු කුඩැල්ලන් අභිජනනාගාරය ඉදිකිරිම.
7. හම්බන්තොට හා මඩකලපුව දිස්ත්‍රික්කවල කකුළුවන් වගා කිරිමේ ව්‍යාපෘතින් ඉදිකිරිම.
8. පුත්තලම දිස්ත්‍රික්කයේ බංගදෙනිය ප්‍රදේශයේ කරදිය විසිතුරු මත්ස්‍ය අභිජනනාගාරය ඉදිකිරිම.
9. පුත්තලම දිස්ත්‍රික්කයේ බංගදෙනිය ප්‍රදේශයේ වේක්කයා මත්ස්‍ය අභිජනනාගාරය ඉදිකිරිම.
10. මන්නාරම දිස්ත්‍රික්කයේ ජලජීවි වගා කර්මාන්තපුරය ඉදිකිරිම.
11. පොලොන්නරුව දිස්ත්‍රික්කයේ සෙවනපිටිය ප්‍රදේශයේ විසිතුරු මත්ස්‍ය අභිජනනාගාරය ඉදිකිරිම.
12. පුත්තලම දිස්ත්‍රික්කයේ නොප්ලියා මධ්‍යස්ථානය ඉදිකිරිම.
13. ADB ව්‍යාතපෘතිය යටතේ ක්‍රියාත්මක "උතුරු පලාත් තිරසාර ධීවර සංවර්ධන" වැඩසටහන යටතේ මුහුදු පැලැටි අභිජනනාගාරය, මුහුදු කුඩැල්ලන් අභිජනනාගාරය, හා වෙරලබඩ ජලජීවී පුහුණු මධ්‍යස්ථානය පිහිටුවීමට දායකත්වය සැපයිම
14. වෙරළ සම්පත් සංරක්ෂණ කලමනාකරණ ව්‍යාපෘතිය යටතේ ප්‍රබල හා කහදමෝදර මිරිදිය ඉස්සන් අභිජනනාගාර පුළුල් කිරිම හා යටිතල පහසුකම් වැඩිකිරිම.

**ජලජීවී ඉංජිනේරු**
**ඉංජිනේරු එස්. ටී. විතානගේ මහතා**

# 12. මානව සම්පත් අංශයේ වාර්ථාව

## 2016 දෙසැම්බර් මස 31 දිනට ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ මිනිස්බල සංවර්ධනය

| වර්ගීකරණය | අංකය |
|---|---|
| **ජ්‍යෙෂ්ඨ කළමනාකරණ** | 05 |
| **මධ්‍යම කළමනාකරණ** | 11 |
| **කණිෂ්ඨ කළමනාකරණ** | |
| ජලජීවී විද්‍යාඥ | 42 |
| ප්‍රාදේශීය/දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාපෘති නිළධාරි | 18 |
| සංඛ්‍යාලේඛන නිලධාරි | 03 |
| පරිගණක විශ්ලේෂක | 01 |
| ප්‍රසම්පාදන නිලධාරි | 01 |
| සමාජ සංවර්ධන නිලධාරි | 01 |
| මූල්‍ය නිලධාරි | 01 |
| පරිපාලන නිලධාරි | 01 |
| **කළමනාකරණ සහකාර (තාක්ෂණ)** | |
| ජලජීවී වගා ව්‍යාපෘති නිලධාරි | 97 |
| ජලජීවී වගා සහකාර | 15 |
| වැඩ මූලික | 01 |
| කාර්මික නිලධාරි | 03 |
| පොත් තබන්නා | 01 |
| කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන) | 70 |
| **ප්‍රාථමික තලය** | |
| රියදුරු | 42 |
| ප්‍රාථමික තලයේ අනෙකුත් | 292 |
| **එකතුව** | **605** |

## නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂික

පාරිතෝෂික මුදල සේවකයා සේවය අවසන් කරන අවස්ථාවේදී ඔහු ලැබූ අවසන් වැටුප දෙකෙන් බෙදා වැඩ කල වසර ගනනින් වැඩිකර ගෙවනු ලැබේ.

මෙම දීමනාව ලබා ගැනිම සඳහා අවම වශයෙන් අධිකාරියේ වසර පහක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු වේ.

මීට අමතරව අධිකාරියේ කාර්යය මණ්ඩලය සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදලේ සාමාජිකයින් වේ. සේවක අර්ථසාධක අරමුදලට අධිකාරියෙන් 15%ක්ද සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදලට 3%ක්ද යොදනු ලැබේ.

- **පුහුණු**
  - දේශීය 30
  - විදේශීය 47
- **ණය**
  - ආපදා ණය
    ස්ථිර සේවකයින්ට උපරිම රු.250,000.00
  - පාපැදි ණය
    ස්ථිර සේවකයින්ට උපරිම රු.10,000.00
  - **පාසැල් අභ්‍යාස පොත් මිලදී ගැනීම සඳහා ණය**
    අධිකාරියේ ස්ථිර කාර්යය මණ්ඩල සාමාජික සාමාජිකාවන්ගේ දරුවන් හට පාසැල් පොත් මිලදී ගැනීම සඳහා උපරිම රු.4,000.00
- **වෛද්‍යය රක්ෂණය**

  ස්ථිර සේවකයින්ට වාර්ෂික රෝහල් ගතවීම් සඳහා රු.100,000.00
  ස්ථිර සේවකයින්ට බාහිර රෝගී ආවරණය රු.5,000.00
- **උත්සව අත්තිකාරම**

  උත්සව කාල සඳහා ස්ථිර සේවකයින්ට උපරිමය රු.10,000.00

**අධ්‍යක්ෂ (වැ. බ.) මානව සම්පත්**
**ඩබ්. එම්. අයි. කේ. විජේසේකර මහතා** (B.sc (HRM) Sp.)

# 13. විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තාව

වර්ෂ 1999 දී ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (NAQDA) ස්ථාපනය කර ඇති අතර, වර්තමානයේ එහි අරමුණු ඉතා සාර්ථක කර ගැනීමට කටයුතු කර ඇත. ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ ප්‍රධාන අරමුණු වන්නේ,

- ඉදිරි වසර හතර තුළ මිරිදිය හා ධීවර මසුන්/ඉස්සන් නිෂ්පාදනය වර්තමාන නිෂ්පාදනය වන මෙට්‍රික් ටොන් 73,930 සිට මෙට්‍රික් ටොන් 130,000 ක් දක්වා වර්ධනය කර ගැනීම.
- පුහුණු හා ණය පහසුකම් සැපයීම තුළින් සංස්කෘතිය පදනම් කරගත් ධීවර හා ජලජීවි වගා ස්වයං රැකියා ආරම්භ කිරීම.
- විසිතුරු මත්ස්‍ය වගාව සහජලජ පැළෑටි වගාව පුළුල් කිරීම තුලින් විදේශ විනිමය ඉපයීම සහ එමගින් ශ්‍රී ලංකාවේ විදේශ වෙළදපොල දායකත්වය 3% සිට 10% දක්වා ඉහළ නැංවීම.
- මීළඟ වසර හතර ඇතුළත අපනයනය සඳහා වන ඉස්සන් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 6,030 සිට අවම වශයෙන් මෙට්‍රික් ටොන් 12,000 දක්වා ඉහළ නැංවීම.
- ඉස්සන් සමඟ වෙනත් වගා කල හැකි විකල්ප මත්ස්‍ය විශේෂ හඳුන්වා දීම සහ කාබනික වගාව හඳුන්වා දීම.
- ජලජීවී වගා පද්ධති වල ආර්ථික ස්ථායීතාවය පෙන්නුම් කිරීම සඳහා රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යවසාය සංවර්ධනය කිරීමසහ කුඩා, මධ්‍යම හා විශාල පරිමණ ව්‍යවසායකයන් දිරි ගැන්වීම.
- ජලජීවී වගා පද්ධතිවල සහ මිරිදිය ධීවර කර්මාන්තයේ තිරසාර ලෙස අස්වනු නෙලා ගැනීම සහ පරිසර හිතකාමී ලෙසත් සිදුවන බවට තහවුරුකර ගැනීම සඳහා අධීක්ෂණ කටයුතු සහ නියාමනය කිරීම.

වර්තමානයේ 600 කට අධික සේවක පිරිසක් අධිකාරිය යටතේ සේවය කරයි. අභ්‍යන්තර විගණන අංශය 2003 ජූලි අග වන විට ආරම්භ කරන ලද අතර, 2016 දී අභ්‍යන්තර විගණන අංශයේ සංයුතිය හා ක්‍රියාකාරීත්වය පහත දක්වා ඇත.

විගණන කමිටු රැස්වීම් පැවැත්වීම විගණන අංශයේ ප්‍රධාන කාර්යයක් වන අතර, විගණන කමිටු රැස්වීම් කටයුතු සියල්ල අභ්‍යන්තර විගණන අංශය මගින් සංවිධානය කරනු ලැබේ.

| අභ්‍යන්තර විගණන අංශයේ කාර්ය මණ්ඩලය | | | නිකුත් කරන ලද අභ්‍යන්තර විගණන වාර්තා සංඛ්‍යාව | පවත්වන ලද විගණන හා කළමනාකරණ කමිටු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ස්ථිර | පදනම් ආධුනිකත්ව | ආධුනිකත්ව පුහුණු | | |
| 03 | - | - | 07 | 02 |

2016 වසර තුළ විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජිකයන් පහත පරිදි වේ.

| අංක | සාමාජිකයාගේ නම | තනතුර පත් කරන ලද්දේ | තනතුර |
|---|---|---|---|
| 01 | හිරන්සා කළුතන්ත්‍රී මිය | සභාපති විගණන හා කළමනාකරණ කමිටු | මහා භාණ්ඩාගාරය |
| 02 | එන්. ඩබ්. අබේගුණවර්ධන මයා | සාමාජික විගණන හා කළමනාකරණ කමිටු | විෂයභාර ඇමතිතුමා |
| 03 | කේ. ජී. ඒ. ගුණරත්න මයා | සාමාජික විගණන හා කළමනාකරණ කමිටු | විෂයභාර ඇමතිතුමා |

මීට අමතරව, ජී. එස්. එස්. ජී. පෙරේරා මහත්මිය (විගණන අධිකාරී), විගණකාධිපති වෙනුවෙන් සහභාගි විය. රැස්වීම් සඳහා අධ්‍යක්ෂ ජනරාල් හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් කැඳවනු ලැබීය. අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් කාර්තුමය වශයෙන් පවත්වනු ලබන අතර, 2016 වර්ෂයේදී, කමිටු සභාපතිගේ ඉල්ලා අස්වීම හා මහා භාණ්ඩාගාරය මගින් නව සභාපතිවරයෙකු පත් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් එම වසරේදී විගණන කමිටු රැස්වීම් 02 කට සීමා කිරීමට සිදු විය. 2016 වසරේදී පහත සඳහන් දිනයන්හි රැස්වීම් පැවැත්විණි.

- 1 වන රැස්වීම 2016.05.11 වන දින පවත්වන ලදී.
- 2 වන රැස්වීම 2016.07.29 වන දින පවත්වන ලදී.

අභ්‍යන්තර විගණක විසින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සංවිධානය කරනු ලබන අතර, අභ්‍යන්තර විගණක හා අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් සියළුම රැස්වීම් වාර්තා සටහන් පවත්වාගෙන යනු ලැබේ.

2016 වර්ෂය තුළ රැස්වීම් සඳහා සහභාගි වීම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| කමිටු සාමාජිකයාගේ නම | රැස්වීම් පවත්වන ලද දිනයන් | |
|---|---|---|
| | 2016. 05. 11 | 2016. 07. 29 |
| හිරන්සා කළුතන්ත්‍රී මිය | සහභාගි විය | සහභාගි විය |
| එන්. ඩබ්. අබේගුණවර්ධන මයා | සහභාගි විය | සහභාගි විය |
| කේ. ජී. ඒ. ගුණරත්න මයා | සහභාගි විය | සහභාගි විය |

**විගණන හා කළමනාකරණ කමිටුවේ වගකීම් නම්,**

- ❖ අධ්‍යක්ෂකවරුන් අතර අදහස් හුවමාරු කිරීම සඳහා කේන්ද්‍රීය ස්ථානයක් ලෙස බාහිර විගණකවරුන් හා ඔවුන්ගේ රාජකාරි සම්බන්ධයෙන් කළමණාකරණය සම්බන්ධව කටයුතු කිරීම සඳහා මූල්‍ය හා වෙනත් වාර්තාකරණය, අභ්‍යන්තර පාලනය සහ විගණනය සම්බන්ධ වන අතර ස්වාධීන සමාලෝචනයක් සැපයීම මගින් එහි වගකීම් ඉටු කිරීම සඳහා මණ්ඩලයට සහාය වීම මූල්‍ය වාර්තාකරණය, අධිකාරියේ අභ්‍යන්තර පාලනයන්හි කාර්යක්ෂමතාවය සහ විගණනයේ කාර්යක්ෂමතාව පිළිබඳව සෑහීමකට පත් විය යුතුය.
- ❖ අධිකාරියේ මූල්‍ය තොරතුරු සමාලෝචනය කිරීම.
- ❖ බාහිර හා අභ්‍යන්තර විගණන විමසුම් සහ පිළිතුරු සමාලෝචනය කිරීම.
- ❖ විගණන සේවාවන් සැපයීම සඳහා බාහිර විගණකගේ සහභාගීත්වය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම.
- ❖ විගණන සැලැස්ම පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට නිර්දේශ ලබා දීම.
- ❖ මණ්ඩලයට වාර්තා කිරිම හා ක්‍රියාත්මක කිරීම හෝ වැඩිදියුණු කිරීම අවශ්‍ය බව සහ කුමන හෝ කරුණු සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම හා නිර්දේශ කිරීම සඳහා ගතයුතු පියවර පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීම.

**ඉහත රාජකාරි වලට අමතරව,**

- ❖ මූල්‍ය පාලනය, අභ්‍යන්තර පාලන පද්ධති අධීක්ෂණය කිරීම.
- ❖ අධිකාරියේ මූල්‍ය පාලනය, අභ්‍යන්තර පාලනය සහ අවදානම් කළමනාකරණ පද්ධතිය සමාලෝචනය කිරීම.
- ❖ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමෙහි උද්ගතවන කාරණා සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කිරීම.
- ❖ මෙහා දක්වා ඇති කරුණු පිළිබඳ මණ්ඩලයට වාර්තා කිරිම.

විගණන කමිටු රැස්වීම් අනුමත කරන ලද සියලුම වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබේ.

**අභ්‍යන්තර විගණක**
**එම්. ඩී. නන්දසිරි මහතා**

# 14. විගණන හා කළමනාකරණ වාර්තාව

**විගණකාධිපති දෙපාර්තමේන්තුව**
**கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்**
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல. / My No. } එෆ්එල්එස්/ඒ/එන්ඒකිව්ඩීඒ/1/16/21 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2017 ඔක්තෝබර් 20 දින

සභාපති,
ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය.

**ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය , හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 2006 අංක 23 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (සංශෝධන) පනතින් සංශෝධිත 1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරි පනතේ 25 (2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

-----------------

2.1 තත්ත්වාගණනය කළ මතය

------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01

------------------------------------------

ප්‍රමිතයේ 70 හා 71 වගන්ති පරිදි මූල්‍ය වාර්තාකරණ දිනයේ සිට මාස 12 කට පෙර සහ මාස 12 කට පසු අයකර ගැනීමට බලාපොරොත්තුවන වත්කම්, ජංගම හා ජංගම නොවන ලෙස වාර්ගීකරණය කළයුතු වුවද ආයතනයේ රු.44,549,328 ක් වූ ආපදා ණය ශේෂය ඒ අනුව වර්ගීකරණය කර දක්වා නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

-------------------------------------------

(i) ප්‍රමිතයේ 47 වගන්තිය පරිදි දේපළ , පිරියත හා උපකරණවල සාධාරණ වටිනාකම් එහි ධාරණ අගයෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස් වනවිට වාර්ෂික ප්‍රත්‍යාගණනයන් සිදුකිරීම සහ ප්‍රමාණාත්මක නොවන වෙනස්කම් සහිත දේපල පිරියත හා උපකරණ සඳහා නිතර සිදුකරන ප්‍රත්‍යාගණනයන් අවශ්‍ය නොවුවද වසර 03 කට හෝ වසර 05 කට වරක් ප්‍රත්‍යාගණනය සිදුකිරීම ප්‍රමාණවත් වුවත්, අධිකාරිය 2012 වර්ෂයෙන් පසුව සියළුම වත්කම් වෙනුවෙන් ප්‍රත්‍යාගණන කටයුතු සිදුකර නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 64 වගන්තිය පරිදි වත්කම් සඳහා වූ ඵලදායී ජීවිත කාලය සළකා වාර්ෂික ක්ෂය අනුපාතය තීරණය කළයුතු වුවත් , එයට පටහැනිව අධිකාරිය විසින් තාක්ෂණික හේතූන් මත සීඝ්‍රයෙන් යල්පැනීමට ලක්වන පරිගණක මෘදුකාංග සහ විද්‍යාගාර උපකරණ වසර 10 ක ඵලදායී ජීවිත කාලයක් සඳහා ක්ෂය ප්‍රතිපාදනය කර තිබුණි.

(ඇ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 08**

-----------------------------------------------

ප්‍රමිතයේ 22 වගන්තිය පරිදි අධිකාරියට එරෙහිව බාහිර පාර්ශවයන් විසින් 2011 වර්ෂයේදී පවරා තිබූ නඩුවක් හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.12,734,000 ක වන්දි මුදලක් ගෙවීමට සිදුවී තිබුණි. මේ සඳහා ඉකුත් වර්ෂවල ප්‍රතිපාදන සලසාගෙන නොතිබීම හේතුවෙන් වර්ෂයේ වියදම හා ඌනතාවය එම ප්‍රමාණයෙන් වැඩිවී තිබුණි.

## 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

---------------------------

සමාලෝචිත වර්ෂය තුළදී කිරි ගවයින් 06 දෙනෙකු රු.309,945 ක වටිනාකමට අගය කර තිබුණද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 132 (ඇ) වගන්තිය පරිදි එසේ අගය කිරීමේදී අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණු අතර ධාරණ අගය වැඩිවීමෙන් වූ අතිරික්තය වූ රු.209,995 ක් ප්‍රත්‍යාගණන සංචිතයට මාරුකර තිබුණි.

## 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අවසාන තොගය ගණනය කිරීමේදී මත්ස්‍ය වගා කටයුතු සඳහා මිළදීගෙන තිබූ රු.361,958 ක් වූ දැල් තොගය අතහැරී තිබීම හේතුවෙන් අවසන් තොගය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ඉකුත් වර්ෂ කිහිපයක සිට පැවත එන අවස්ථා 175 කදී එකතුව රු. 1,543,141 වූ ඍජු බැංකු බැරකිරීම් හඳුනාගෙන ගිණුම්ගත කිරීම වෙනුවට මාසික බැංකු සැසඳුම් ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මාර්තු 30 දින සිට භාවිතයට ගෙන තිබූ රු.6,500,000 ක් වූ මෝටර් රථය සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු.975,000 ක ක්ෂය ගැලපීම් සිදු කර නොතිබුණි.

(ඇ) උඩවලව තිලාපියා මධ්‍යස්ථානයේ ඉදිකරන ලද රු.1,967,756 ක් වූ මඩපොකුණු 2016 ජනවාරි 12 දිනදී නිමකර භාවිතයට ගෙන තිබුණද අදාල වත්කම් ප්‍රාග්ධනිත කිරීමෙන් තොරව කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම් ගත කර තිබුණි. මේ හේතුවෙන් ඊට අදාල රු.114,183 ක් වූ ක්ෂය ගිණුම්ගත කිරීම මගහැරී තිබුණි.

(ඉ) ආයතනයේ ඉංජිනේරුවරයාට ගෙවන ලද වැඩබිම් නිරීක්ෂණ ගාස්තු , කමිටු සාමාජික ගාස්තු සහ දැන්වීම් ගාස්තුව වූ රු.387,051 ක් පරිපාලන වියදම් යටතේ දැක්වීම වෙනුවට කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කර තිබුණි.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනය වෙත ඉදිරිපත්කර නොතිබුණි.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| දිවිනැගුම - චක්‍රීය අරමුදල | 32,679,030 | - i. නැවත අයකරගැනීම් පිළිබඳ විස්තර ඇතුළත් ලේඛනය<br>- ii. ණයගැති කාල විශ්ලේෂණය. |
| දිවිනැගුම - මත්ස්‍ය ඇඟිල්ලන් තොගය | 1,258,960 | - ඇඟිල්ලන්ගේ වර්ගීකරණය සහිත උපලේඛන |

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මත්ස්‍ය පැටවුන් විකිණීමෙන් ඇතිවූ රු.13,739,176 ක් වූ ණයගැති ශේෂය තුළ වර්ෂ 05 ඉක්මවූ රු.3,041,702 ක් හා වර්ෂ 03 ඉක්මවූ රු.1,779,992 ක් අයකර ගැනීමේ කටයුතු මන්දගාමීව පැවතිණි.

(ආ) වසර 05 කට වැඩි කාලයක සිට මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත් රු.363,329 ක් වූ රඳවා ගැනීමේ බදු ශේෂය (WHT) නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2001 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා පැවත එන රු.8,377,714 ක් වූ කොන්ත්‍රාත්කරුවන්ගෙන් රඳවා ගැනීමේ ගිණුමේ ශේෂය හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| මුදල් රෙගුලාසි 751 | පුස්තකාලයට ලැබෙන සියලුම පොත්, පරිග්‍රහණ ලේඛන පොතෙහි ඇතුළත් කළයුතු වුවද, 2016 දෙසැම්බර් මස 31 දිනට පුස්තකාලයේ පවතින සියලුම පොත් පරිග්‍රහණ ලේඛනවල ඇතුළත් කර නොතිබුණි. |
| (ආ) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක, උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඇ) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1.6 ඡේදය හා 3.1.7 ඡේදය | සමාලෝචිත වර්ෂයට අදාළව භාණ්ඩ සමීක්ෂණය සිදුකර ඊට අදාළ වාර්තා විගණකාධිපති වෙත යොමුකර නොතිබුණි. |
| (ඈ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය | මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. |

2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

මූල්‍ය ප්‍රකාශනවල දිගින් දිගටම පැවති ලැබිය යුතු කල්බදු කුලිය රු.403,594 ක් හා අවලංගු කළ චෙක්පත් ගිණුමේ රු.149,203 ක් පිළිවෙලින් නීති වියදම් ගිණුමෙන් සහ වෙනත් ආදායම් ගිණුමෙන් සමාලෝචිත වර්ෂයේදී කපා හැර තිබුණද මේ සඳහා විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු.36,533,378 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.11,443,032 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.47,976,410 කින් පිරිහී තිබුණි. රාජ්‍ය ප්‍රදානයන් හා විලම්භිත ආදායම් පිළිවෙලින් රු.26,509,750 ක් හා රු.21,270,580 කින් වැඩිවුවද , පරිපාලන වියදම් රු.63,475,658 ක් හා බෙදාහැරීම් වියදම් රු.26,957,218 කින් වැඩිවීම ඉහත පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ රු. 20,364,390 ක් වූ ඌනතාවය 2015 වර්ෂයේදී රු. 11,443,032 ක අතිරික්තයක් දක්වා වර්ධනය වී තිබුණද 2016 වර්ෂයේදී නැවතත් රු.36,533,378 ක ඌනතාවයක් වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය හා සේවක පාරිශ්‍රමික නැවත ගැලපීමේදී 2012 වර්ෂයේ රු.208,579,857 ක්ව පැවති අධිකාරියේ දායකත්වය 2016 වර්ෂය අවසානයට රු.377,818,292 දක්වා වර්ධනය වී තිබුණි.

### 3.2 ආයතනයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි

සේවකයෙකු විසින් නැවත රැකියාව ලබාගැනීම සඳහා 2015 ජුනි 22 දින ආයතනයට එරෙහිව නඩුවක් පවරා තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

4.1 කාර්යසාධනය

-----------------

2006 අංක 23 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය(සංශෝධන) පනත මඟින් සංශෝධනය කරන ලද 1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරි පනතේ 11 වැනි වගන්තිය ප්‍රකාරව එහි කර්තව්‍යවයන් පහත පරිදි වේ.

(අ) රට තුළ මත්ස්‍ය නිෂ්පාදනය සහ පරිභෝජනය වැඩිකිරීමේ අරමුණින්, මිරිදිය, කිවුල්දිය, වෙරළබඩ හා සමුද්‍රීය ජලජීවී වගාව වැඩි දියුණු කිරීම හා එමගින් රැකියා අවස්ථා ඇතිකර ගැනීම හා ප්‍රවර්ධනය කිරීම.

(ආ) අපනයනය සඳහා විසිතුරු මත්ස්‍ය විශේෂ ඇතුලුව වැඩි වටිනාකමක් ඇති මත්ස්‍ය වගාව ප්‍රවර්ධනය කිරීම සහ ජලජීවී වගාව සඳහා පෞද්ගලික අංශයේ සුළු , මධ්‍යම හා මහා පරිමාණ ආයෝජන ප්‍රවර්ධනය කිරීම , පහසුකම් සැලසීම සහ වැඩිදියුණු කිරීම.

(ඇ) ජෛව විවිධත්වය ආරක්ෂා වන පරිදි , ජලජීවී වගාව සහ ජලජීවී වගා මෙහෙයුම් සඳහා යොදාගනු ලබන ජලජ සම්පත් සහ නිත්‍ය සහ කාලීන ජලාශයන්හි වගාව පදනම් කරගත් ධීවර කර්මාන්තය කළමනාකරණය කිරීම , සංරක්ෂණය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා වූ සැලසුම් හා පරිසර හිතකාමී වගා වැඩසටහන් සකස් කර ක්‍රියාත්මක කිරීම.

(ඈ) ජලජ සම්පත් ආනයනකරුවකු , අපනයනකරුවකු , අලෙවිකරුවකු , සපයන්නකු හා බෙදාහරින්නකු ලෙස ව්‍යාපාරය කරගෙනයාම සහ එම කාර්යයන්හි යෙදී සිටින තැනැත්තන්ට සහාය වීම යනාදිය වේ.

සමාලෝචිත වර්ෂය තුළදී ඉහත සඳහන් අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරියේ ප්‍රධාන කර්තව්‍යයක් වූ ජෛව විවිධත්වය ආරක්ෂා වන පරිදි ජලජීවී වගාව සහ ජලජීවී වගා මෙහෙයුම් සඳහා යොදාගනු ලබන ජලජ සම්පත් සහ නිත්‍ය සහ කාලීන ජලාශයන්හි වගාව පදනම් කරගත් ධීවර කර්මාන්තය කළමනාකරණය කිරීම , සංරක්ෂණය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා වූ සැලසුම් හා පරිසර හිතකාමී වගා වැඩසටහන් සකස්කර ක්‍රියාත්මක කිරීම සිදුකර නොතිබුණි.

(ආ) අධිකාරිය විසින් මිරිදිය ජලාශ වල මත්ස්‍ය ඇඟිලිලන් තැන්පත් කිරීම 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේදී මිලියන 12.6 කින් වැඩිවී තිබූ අතර ඇඟිලිලන් තැන්පත් කිරීම තුළින් ලබාගන්නා ප්‍රගතිය (පසු අස්වැන්න) මැනීම හා වැඩිදියුණු කිරීම සඳහා සමීක්ෂණ හා පර්යේෂණ සිදුකර නොතිබුණි. මේ සම්බන්ධයෙන් රජයේ එකම පර්යේෂණ හා සංවර්ධන ආයතනය වන ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය මගින් මත්ස්‍ය නිෂ්පාදනය ප්‍රවර්ධනය කරගැනීම සඳහා උපදෙස් හා පර්යේෂණ සිදුකර ගැනීමද කර නොතිබුණි.

(ඇ) 2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා නිෂ්පාදනය කල මිරිදිය මත්ස්‍ය ඇසිත්තන් හා ඇඟිලිලන් පිළිබඳ පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2014 වර්ෂයේදී මත්ස්‍ය ඇඟිලිලන් නිෂ්පාදනය මිලියන 40.98 ක් වී තිබූ අතර වගා නිෂ්පාදනය මෙ.ටො 70,600 ක් විය. 2014 වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මත්ස්‍ය ඇඟිලිලන් මිලියන 66.47 කින් වැඩිවී තිබුණද මත්ස්‍ය නිෂ්පාදන මෙ.ටො. 67,480 දක්වා අඩුවී තිබුණි.

(ii) 2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා මත්ස්‍ය ඇසිත්තන් නිෂ්පාදනය මිලියන 83.10 සිට මිලියන 112.27 ක් දක්වා මිලියන 29.17 කින් වැඩිවී තිබුණද මත්ස්‍ය ඇඟිලිලන් නිෂ්පාදනය ඊට සාපේක්ෂව වැඩිවී නොතිබුණි.

(iii) 2014 වර්ෂයට සාපේක්ෂව 2015 හා 2016 වර්ෂවල මිරිදිය ජලජීවී වගා නිෂ්පාදනය පිළිවෙලින් මෙ.ටො.10,390 කින් හා මෙ.ටො 3,120 කින් අඩුවී තිබුණි.

(iv) 2015 සහ 2016 වර්ෂයේ තොරතුරු අනුව පිළිවෙලින් දිස්ත්‍රික්ක 11 ක සියයට 25 සිට සියයට 73 දක්වා වූ පරාසයකින් සහ දිස්ත්‍රික්ක 06 ක සියයට 23.5 සිට සියයට 75 දක්වා වූ පරාසයකින් ඇඟිලිලන් තැන්පත් කිරීමේ ඉලක්ක සපුරා නොමැති බව නිරීක්ෂණය විය. මේ පිළිබඳව කළමනාකරණයේ අවධානය යොමුවී නොතිබූ අතර ජලජීවී වගා සංවර්ධන අධිකාරිය පිහිටුවීමේ මූලික අරමුණ වන මත්ස්‍ය සම්පත් ප්‍රවර්ධනය යන අරමුණ ප්‍රමාණවත් ලෙස ඉටුවී නොතිබුණි.

(v) 2015 සහ 2016 වර්ෂය තුළදී ගම්පහ, කළුතර , මාතර , කෑගල්ල යන දිස්ත්‍රික්ක වල පිහිටා ඇති මිරිදිය ජලාශවල මත්ස්‍ය ඇඟිලිලන් තැන්පත් කිරීමේ ඉලක්කයන් ලෙස අධිකාරිය විසින් අදාල මධ්‍යස්ථානවලට ලබාදී තිබුනේ පිළිවෙලින් මිලියන 0.334 , 0.345 , 0.349 හා 0.054 ක් වුවත් එම දිස්ත්‍රික්ක ආවරණය වන ආකාරයට කිසිදු මත්ස්‍ය ඇඟිලිලන් තැන්පත් කිරීමක් සිදුකර නොතිබුණි. මේ අනුව මිරිදිය මත්ස්‍ය

නිෂ්පාදනය සහ පාරිභෝජනය වැඩි දියුණු කිරීම හා ධීවර ජනතාවගේ රැකියා අවස්ථා ඇතිකර ගැනීම හා ප්‍රවර්ධනය කිරීම යන අරමුණ ඉටු වී නොතිබුණි.

(ඈ) ආයතනය, රටතුළ මත්ස්‍ය නිෂ්පාදනය සහ පරිභෝජනය වැඩි දියුණු කිරීමේ අරමුණින් මිරිදිය කිවුල්දිය , වෙරළබඩ හා සමුද්‍රීය ජලජීවී වගාව වැඩිදියුණු කිරීම හා එමගින් රැකියා අවස්ථා ඇතිකිරීම හා ප්‍රවර්ධනය යන අරමුණ ඉටුකරගැනීම සඳහා 2011, 2012 , 2013 සහ 2014 යන වර්ෂ වලදී දිවිනැගුම ණය යෝජනා ක්‍රමය මගින් ප්‍රතිලාභීන් 6450 ක් සඳහා රු.229,035,250 ක් ලබාදී තිබුණද එම වැඩසටහන පහත සඳහන් හේතු නිසා අසාර්ථක වී තිබුණි.

- ප්‍රතිලාභීන් තෝරාගැනීමේදී එම ප්‍රදේශවල ජල හිඟය පිළිබඳව අවධානය යොමු නොකිරීම.

- ප්‍රතිලාභීන් නිසි පරිදි පුහුණු නොකිරීම.

- ව්‍යාපෘති ආරම්භයේදී දෙන ලද පොදු උපදෙස් මාලාව අනුව “ දිවිනැගුම ” ව්‍යාපෘති හිමියන්ගේ ග්‍රාමීය සංවිධානයක් හෝ දිස්ත්‍රික් සංවිධානයක් ස්ථාපිත කළයුතු වුවද එවැනි ග්‍රාමීය හෝ දිස්ත්‍රික් සංවිධානයක් ක්‍රියාත්මක නොවීම.

- ජලජීවී වගා නිලධාරීන් විසින් පසුවිපරම් නොකිරීම.

(ඉ) අධිකාරියේ ක්‍රියාකාරී සැලැස්ම තුළ ආයතනයේ කර්තව්‍යයන් වෙන් වෙන්ව ගෙන සැලසුම් කිරීම වෙනුවට ප්‍රධාන මාතෘකා හතරක් යටතේ ක්‍රියාකාරකම් සැලසුම්කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ කාර්යසාධන වාර්තාවට අනුව ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුලත් වූ ක්‍රියාකාරකම් ඉටු කිරීමේ ප්‍රගතිය පිළිබඳ පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) කලාවැව ජාතික මිරිදිය ධීවර හා ජලජීවී පුහුණු ආයතනයේ සම්පත් දායකයන්ගේ නේවාසිකාගාරය ඉදිකිරීම සඳහා රු.මිලියන 12.62 ක් වෙන්කර තිබූ අතර ප්‍රගති වාර්තා අනුව ඒ සඳහා රු.මිලියන 10.96 ක් වැයකර තිබුණද ඒ තුල ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් නොවූ ද්විත්ව නේවාසිකාගාරය(Twin Quarters) ඉදිකිරීම සඳහා වැයකළ රු.මිලියන 2.24 ක් ඇතුළත්කර තිබුණි.

(ii) එසේම ඉඟිනියාගල ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානයේ කම්කරු නේවාසිකාගාරය අලුත්වැඩියා කිරීම සඳහා රු.මිලියන 2.51 ක් වෙන්කර තිබුණද අදාල කාර්යය සිදු කිරීමකින් තොරව ඒ සඳහා වෙන්කළ මුදලින් ගුරුත්ව අභිජනනාගාරයේ වැඩ

නිමකර තිබුණි. සමාලෝචිත වර්ෂයේ කම්කරු නේවාසිකාගාරය අළුත්වැඩියා කටයුතු සිදුකර නොතිබියදී එහි භෞතික ප්‍රගතිය සියයට සියයක් ලෙස දක්වා තිබුණි.

(iii) මසුන් තොග කළමනාකරණය සහ ධීවර හා ජලජීවී වගා කටයුතු වැඩිදියුණු කිරීම සඳහා රු.මිලියන.1.16 ක් වෙන්කර තිබුණද ඉන් රු.මිලියන 0.79 ක් හෙවත් සියයට 32 ක් වැයකර නොතිබුණි. තවද අපේක්ෂිත ඉලක්ක දත්ත සැලැසුම් කර නොතිබීම නිසා භෞතික කාර්යසාධනය ඇගයීමට ලක්කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දිවිනැගුම වැඩසටහන, චක්‍රීය අරමුදලක් ලෙස පවත්වාගෙන යාම සඳහා ලබාදුන් මුදලින් සියයට 50 ක් ආපසු අයකරගැනීමට ප්‍රතිලාභීන් සමග ගිවිසුම් ගතවී ආපසු අයකරගැනීම් සඳහා ක්‍රමවේද හඳුන්වා දී තිබුණද , එම ක්‍රමවේද ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) දිවිනැගුම ප්‍රතිලාභීන්ට ගිවිසුම් ප්‍රකාරව මූල්‍යාධාර සහ තාක්ෂණික උපදෙස් ලබා දිය යුතු අතර ප්‍රතිලාභීන් එකී තාක්ෂණික උපදෙස් වලට අනුකූලව ව්‍යාපෘති අවසන් කිරීමට ගිවිසුම් ගතවී තිබුණද , දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති නිලධාරීන් විසින් තාක්ෂණික උපදෙස් වලට අනුව ව්‍යාපෘති ක්‍රියාත්මක වන බවට පසු විපරම් කටයුතු සිදුකර නොතිබුණි. ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කල පොදු උපදෙස් මාලාව අනුගමනය නොකිරීම, විධිමත්ව වාරික මුදල් අයකිරීමේ ක්‍රමවේද ක්‍රියාත්මක නොකිරීම, මත්ස්‍ය අස්වැන්න වැඩිවීම පිළිබඳ සමීක්ෂණ දත්ත අධිකාරිය සතුව නොතිබීම, ව්‍යාපෘතිය සම්බන්ධව පසු විපරම් කටයුතු සිදු නොකිරීම වැනි දුර්වලතා පවතින බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(ඇ) අධිකාරිය විසින් භාවිතා කරනු ලබන හෙක්ටයාර 38.7526 ක ඉඩම්වල අයිතිය අධිකාරිය වෙත 2017 සැප්තැම්බර් 30 දින දක්වාම පවරාගෙන නොතිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

----------------------------

